
ස යු රෙ න්

# එතෙර

එතෙර ශ්‍රමයට මෙතෙර උපහාරය

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී.
1 වන කාණ්ඩය 1 වන කලාපය
2020 ජූලි

- ලොක්ඩවුන්....
- ලෝකයම කොර කරන කොරෝනා....
- මැතිවරණ සටන



- කොරෝනා ජයගත් චීන්නු
- පාතාලය හා එක්වුණු නාකොටික් ..
- ආතරයිටීස්...
- දරු සෙනෙහස කියන සුනාමිය...



## COVID 19

## කොරෝනා වසංගතය පරදවමු.

ස යු රේ න්
# එතෙර
එතෙර ශ්‍රමයට මෙතෙර උපහාරය.
අංක 450, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.
දුරකථන : +94 11 2689500-508 ෆැක්ස් : +94 11 2689510/2674347
ඊ මේල් : csl123@sltnet.lk අන්තර්ජාලය : www. ceylonshippinlines.com

## කාලයට අනුකූලව

මෙයින් වසර 21 පෙර සිලෝන් ෂිපිං ලයින්ස් සමාගම සයුරෙන් එතෙර පුවත්පත ආරම්භ කරනු ලැබුවේ විදේශගතව සිටින ශ්‍රී ලාංකික ප්‍රජාව වෙනුවෙනි. ඔවුන්ගේ කාන්සිය මහන්සිය විඩාව දුරලමින් නිර්මාණ ශීලී හැකියාව දියුණු කරමින් ඔවුන් හා තනි නොතනියට සිංහල පුවත්පතක් වශයෙන් “සයුරෙන් එතෙර” නොමිලේ ඔබ අතට පත්විය.

ශ්‍රී ලංකාවේ තොරතුරක් ආරංචියක් ලබාගැනීම අතිශය දුෂ්කරවූ තාක්ෂණය නොදියුණු දුරකථන පහසුකම් නැති අන්තර්ජාල පහසුකම් නොමැති ඒ යුගයේ සිංහල අකුරක් දකින්න නම් ගෙදරින් ලියුමක්ම ආ යුතුව තිබූ යුගයේ “සයුරෙන් එතෙර” විදෙස්ගත ශ්‍රමිකයින් ගේ නෙතට රසඳුනක් විය.

විදෙස් රටවල ප්‍රධාන නගරවලට පමණක් ජාතික පුවත්පත් ඉතා සුළු ප්‍රමාණයක් පැමිණි අතර ඒවාද ඉහළ මිල ගනන් යටතේ අලෙවි වූ අතර ඉහළ රැකියාවල් වල නියුතු වූවන්ට පමණක් සීමා විය. එවන් යුගයක විශේෂාංග පුවත්පත් වලින් යුත් විදෙස් ශ්‍රමිකයින් උදෙසාම මුද්‍රණය වූ “සයුරෙන් එතෙර” පුවත්පත නොමිලේ ඔබ අතට පත්වූ අතර ඇතැම් විටක එය ඔබ සිටි සේවා ස්ථානයටම නොමිලේ ලැබිණ.

විදේශගත වූවන්ගේ දුක් කඳුළු අදෝනා පමණක් නොව ඔවුන්ගේ දක්ෂතා හැකියාවන් සේවාවන් එළි දැක්වූ “සයුරෙන් එතෙර” පුවත්පත නිරන්තරයෙන් විදෙස් ශ්‍රමිකයින් ගේ හඬ බවට පත්විය. එම තත්ත්වය තේරුම් ගත් බොහෝ සේවා ආයතන අප හා එදත් අදත් එලෙසම සක්‍රීය දායකත්වය ලබා දෙමින් සිටිති. අප ගේ පාඨක ප්‍රජාව ද එලෙසම අප හා බැඳී සිටිති.

කාලයේ වෙනස්වීමත් සමග ලෝකයම තාක්ෂණය කරා යද්දී අප ගේ ශ්‍රමිකයින්ද එම තාක්ෂණයේ කොටස්කරුවන් බවට පත්වීම සතුටට කරුණක්. ලෝකයේම දැනුම හා තොරතුරු සයිබර් අවකාශයට එක් වෙද්දී අපි ද ඒ හා බැඳී කටයුතු කිරීමට අදිටන් කළෙමු.

පෙර කීප දෙනෙකු අත එක් මුද්‍රණ පිටපතක් හුවමාරු වූ යුගය අවසන් කර සෑම අයෙකුටම එකවර තමා සිටින තැන සිටම බැලීමට හැකි වන පරිදි “සයුරෙන් එතෙර” අන්තර් ජාලයට එක්වීම බොහෝ දෙනෙකුගේ දීර්ග කාලීන ඉල්ලීමක් මල්පල ගැන්වීමක්.

ඒ අනුව 2020 අගෝස්තු මාසයේ සිට ”සයුරෙන් එතෙර” පුවත්පත් **www.ceylonshippinlines.com** හරහා ඔබගේ දුරකථනයෙන් හෝ පරිගණකය මගින් අන්තර්ජාලය ඔස්සේ බලා ගැනීමට ඉඩ සලසා ඇත.


මෙතෙක් මුද්‍රිත පුවත්පතක් ලෙස ඔබ අතට පත්වූ පුවත්පත එලෙසින්ම අන්තර්ජාලය මගින් ලොවපුරා ඕනෑම රටක සිටින අයෙකුට කියවීමේ හැකියාව ඇති අතර මුද්‍රිත පුවත්පතක් ලෙස මින් ඉදිරියට මුද්‍රණය නොවේ.

ඔබට අප හා එක් වෙමින් ලෝකය හා බැදෙමින් අන්තර් ජාතික වශයෙන් අදහස් උදහස් නිර්මාන හුවමාරු කර ගැනීමේ මහඟු අවස්ථාව “සයුරෙන් එතෙර” පුවත්පත සමග හැකි වනු ඇත.

ඔබගේ ජායාරූප, සංචාරක සටහන්, සේවා විස්තර, අත්දැකීම්, නිර්මාණ, ප්‍රවෘත්ති, සමාජ සත්කාරයන් අප හා බෙදා හදා ගනිමින් ලොව පුරා විසිරී පැතිරී සිටින ලාංකිය ප්‍රජාව සමඟ හුවමාරු කරගන්නා ලෙස ඉල්ලා සිටිමු.

ඔබගේ නිර්මාණශීලී හැකියාවන් සඳහා මෙම අන්තර්ජාල පුවත්පත තුළ ඕනෑ තරම් ඉඩ කඩ ලබා ගත හැකි අතර නිරන්තරයෙන් අප හා බැඳී සිටිනු අතැයි අපි විශ්වාස කරමු.

## වසර 15 ට පෙර ලියූ
# ලොක්ඩවුන් නවකතාව




බ්ලැක් හවුස්, ලූවින් මැණ්, කොෆින් රෝඩ්, එන්ට්‍රි අයිලන්ඩ්, චෙස් මෙන්, මැන් විත් නෝ ෆේම්, ආදී අතිශයය ජනප්‍රිය නවකතා රැසක් ලියා ඇමරිකා හා ප්‍රංශ සාහිත්‍ය සම්මාන රැසකින් පිදුම් ලැබූ ස්කොට්ලන්ත ජාතික සාහිත්‍යකරුවෙකු වූ පීටර් මේ නම් ගත් කතුවරයා මෙයට වසර 15 ට පෙර “ලොක් ඩවුන්” නමින් නවකතාවක් ලීවේය. තිර රචකයෙකු මෙන්ම ත්‍රාස ජනක කතා ලිවීමේ අති දක්ෂයෙකු වූ මොහු ලියන ලද ලොක් ඩවුන් නවකතාවට පාදක වූයේ ලන්ඩන් නගරයෙන් පැතිරෙන වෛරස් ආසාදයක් හේතුවෙන් ලන්ඩනය වැනි විශාල නගරයක් වසා දැමීම නිසා ජනතාවට ඇති වන පීඩනය පිළිබඳව ත්‍රාසය භීතිය උපේක්ෂාව ඇතුළු අත්දැකීම්ය.

කෙසේ වෙතත් ඔහුගේ පොත් ප්‍රකාශකයා එම පොතේ අත් පිටපත ලබා දුන් සැනින් කියවා බැලුවේ හැකි ඉක්මනින් මුද්‍රණය කිරීමකටය. හේතුව පීටර් ගේ මේ පොත් ඉතා සීඝ්‍රයෙන් අලෙවි වන බැවිනි.

ඔහු මේ පොත භාර දුන්නේ 2005 වසරේ දිනකය. පසුදාම ප්‍රකාශකගෙන් පීටර්ට දුරකථන ඇමතුමක් ලැබුණි.

එයින් ප්‍රකාශකයා කියා සිටියේ මේ පොත වැඩක් නෑ. ලෝකය පුරා පැතිරෙන වසංගත. ඒ විතරක්ද ලන්ඩන් වගේ නගරයක් වහන්න පුළුවන්ද. කවදාවත් යථාර්ථයක් නොවන මිත්‍යාවක් මේ පොත මුද්‍රණය කරන්න බෑ. ප්‍රකාශක එසේ කියූ විට පීටර් ද සිය ප්‍රබන්ධය පිළිබඳ අදහස අතැරියේය. කාලයත් සමඟ එය අමතක වී ගියේය.

ඉන් වසර 15 ක් ගෙවුණු අද දිනයේ ලොව පුරා ඇසෙන්නේ “ලොක් ඩවුන්” යන වචනයයි. “ලොක් ඩවුන්” යනු රටක් හෝ නගරයක් හෝ පළාතක් ප්‍රදේශයක් ගමක් අගුළු දැමීමය. වසා දැමීමය.

චීනයේ වුහාන් පළාතෙන් මතුවූ කොවිඩ් 19 වසංගතය හේතුවෙන් අද ලොව පුරා මිලියන ගණනක් ජනතාව නිවෙස් තුළ සිරවී සිටිති. නගර පමණක් නොව රටවල් පිටින්ම ලොක් ඩවුන් වී තිබේ.

පීටර් තම කතාව මුලාශ්‍ර සොයා ගත්තේ 1985 න් පසු පැතිරුණ කුරුළු උණ වසංගතය හා ඒ පිළිබඳව වෛද්‍ය විශේෂඥයන් සිදුකළ ප්‍රකාශ හා පර්යේෂණ පාදක කරගනිමිනි. ඒ පිළිබඳව තොරතුරු අධ්‍යයනයක යෙදී සිටින විටක පීටර්ට මෙවැනි අදහසක් පහළ විය.

හදිසියේම ලන්ඩන් නුවරින් වෛරස් රෝගයක් පැතිරිලා ජනතාව ගෙවල් තුළ කොටු වුණොත් මක්වෙයිද? ඒ සිතිවිල්ල ඔහු ඉතා අගනා ලෙස විචිත්‍රවත් ලෙස සිය නවකතාව තුළ ප්‍රතිරූපනය කර ඇත.

සමාජ ක්‍රියාකාරකම් නොමැතිව ජනතාව කොටුවීම නිවෙස් තුළ සිරකරුවන් වීම, ආහාර හිඟවීම, අත්‍යාවශ්‍ය දේ නැතිවීම. ඒ තුළින් හට ගන්නා අතුරුඵල, ජනතා මානසිකත්වය, මේ ආදී ලෙසින් පීටර් ගේ පොත පත අංශ ගනනාවක් ඔස්සේ වර්ණවත් වී තිබුණි.

**එහිදී පිටර් කියා සිටියේ "කෝවිඩ් 19 ආවේ වුහාන් වලින් මගේ පොතේ තියෙන වෛරසය මතුවන්නේ ලන්ඩන් වලින් ඒ අතර ලොකු වෙනසක් තියෙනවා. නමුත් ගෝලීය වසංගත තත්ත්වය හා ලන්ඩන් වගේ නුවරක් වැසූ විට ඇති වන බියකරු තත්ත්වය හැකි හැම අයුරින්ම මම පොතේ දක්වලා තියෙනවා. එදා මට හැඟුණ ඒ ස්වභාවය අද ත්‍රාසජනක හා බියකරු අන්දමින් හැමෝම අත්විඳිනවා." පීටර් එසේ කීවේය.**

කෙසේ නමුත් අද වන විට කොරෝනා උවදුරින් ලොවම ලොක් ඩවුන් වී ලක්ෂ සංඛ්‍යාත ජනයා මරණයට පත්වෙමින් සිටිති.

4 වෙනි පිටුවට....

ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට

පිටරට සිට එවන මුදල් ලබාගන්නා ඔබ සඳහාම
විශේෂිත රෙමිටන්ස් කාඩ්පතක්




ඔබේ රෙමිටන්ස් කාඩ්පත අදම ලබාගෙන මෙම සියලු වාසි අත්විඳින්න.

- ආරම්භක ගාස්තු නොමැතිව නොමිලේ කාඩ්පතක් ලැබීම.
- පිටරට සිට ලැබෙන මුදල් එසැණින් ඔබගේ ගිණුමට ලැබීම.
- දවසේ ඕනෑම වේලාවක මුදල් ලබාගැනීමට දිවයින පුරා විහිදුනු ATM ජාලය.
- විවිධ භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට Debit Card පතක් ලෙසින්ද ශ්‍රී ලංකාවේ සහ පිටරට දී භාවිතා කිරීමේ හැකියාව.
- කාඩ්පත් හිමියන් සඳහා වසර පුරා හිමිවන සුවිශේෂී වට්ටම් හා දීමනා.
- පිටරට සිට එවන මුදල් ලබාගන්නන් හට ලබාදෙන සුවිශේෂී 'එහ@සි ණය' පහසුකම.
- බැංකුව මගින් පවත්වන ප්‍රවර්ධන වැඩසටහන් වලදී වැඩි දිනුම් අවස්ථා හිමිවීම.
- බැංකුවේ සුවිශේෂී ගණුදෙනුකරුවන් හට හිමිවන වරප්‍රසාද වැඩසටහන් සඳහා සුදුසුකම් ලැබීම.

කොමර්ෂල් බැංකුවේ **e-Exchange,** වෙලාවට පරිස්සමට පිටරට සිට මුදල්

100 YEARS

COMMERCIAL BANK

*කොන්දේසි සහිතයි | Fitch Rating AA (lka) | +94 112 353 576 | www.combank.lk

ඔබේ ජය අපේ පැතුමයි

# ලෝකයම කොරර කරන කොරෝනා



විස්සයි විස්ස උදාවත් සමග ලෝකයම භීතියට ලක්කළ චීනයේ කොරෝනා වසන්ගතය ලොවට අලුතින්ම එක්වූ වෛරස් රෝගයක් විය. හිටි අඩියේ හදිසියේම චීනයේ වුහාන් නගරය තිඹිරිගෙය කරගනිමින් කොරෝනා වෛරසය එරට පුරා පැතිරෙන්නට පටන් ගෙන ඇත.

චීනයේ අගනුවර වන බීජිං නුවරට කි.මී. 650 ක් දුරින් පිහිටා ඇති වූ හැන් නගරයේ මාංශ අලෙවි සැලකින් මෙම වෛරසය පැතිරියාම ආරම්භ වූ බවට ඔවුහු විශ්වාස කරති. චීන මාංශ අලෙවි සැල් වල බලු මස් නයි මස් බළල් මස් ආදී අපවැනි රටවල ජනයා පිළිකුල් කරන විවිධ උරගයින් ගේ මස් ද වැඩි වශයෙන් අලෙවි වෙයි. තලු මරමින් කරන මාංශ අනුභවය චීනයේ බහුලව සිදුවෙයි. කෙසේ නමුත් මාංශ අතුරින් පැන නැගුණ මිනිස් ජීවිත වලට බරපතල තර්ජනයක් වූ මෙම කොරෝනා වෛරසය පිළිබඳව ලෝක සෞඛ්‍ය සංවිධානයේ අවධානයට ලක්වන්නේ ජනවාරි පළමුවනදාට පෙර දිනයේය.

මේ වනතුරු මේ සඳහා කිසිඳු ඖෂධයක් සොයාගෙන නැති අතර එය බෝ වීමේ සීඝ්‍රතාවය ඉතා ඉහළය. චීනය මෙම උවදුරෙන් බේරීම සඳහා දැවැන්ත මෙහෙයුමක් ආරම්භ කර ඇත. ඔවුන් දින 07 ක් දින 10 ක් ඇතුළත ඇඳන් 2000 ට වැඩි අංග සම්පූර්ණ රෝහල් දෙකක් ඉදි කළහ.

ඔවුන් සතු ධනය බලය ඥානය සියල්ල මේ සඳහා යොමු කොට ඇත. ඔවුන් සතු ඉහළම තාක්‍ෂණය මේ සඳහා යොදවා ඇත. ඩ්‍රෝන තාක්ෂණය, රොබෝ තාක්ෂණය ද උපයෝගී කරගෙන ඇත. නීතිය හා බලය ද උපරිමයෙන් රෝග ව්‍යාප්තිය මර්ධනය සඳහා යොදවා ඇත. වුහාන් නගරය සහමුලින් වසා දැමූ අතර එහි වාසය කළ දෙස් විදෙස් සියල්ලෝම එහි සිරවූහ. ඒ අතරින් ලාංකීය සිසුන් 33 ක් ද වූහ.

චීනය සහමුලින්ම අක්‍රිය වී ඇති අතර එහි



**මෙම වෛරසය පිළිබඳව පුරෝකථන සිදුකරන විශේෂඥයන් පවසන්නේ වර්ධන වේගය 60% ක් බවය. නිසි පරිදි මේ සඳහා සුදුසු ඖෂධයක් හෝ මෙම වෛරසය පාලය කිරීමට වැඩ පිළිවලක් සකස් නොවුණහොත් ලෝක ජනගහනයෙන් 60% ක් පමන විනාශවීමේ ඉඩකඩ ඇති බවය.**

සෙසු පරිපාලන කටයුතු පසෙකට දමා කොරෝනා වසංගතයට එරෙහි මෙහෙයුම් අරඹා ඇත. ඒ අනුව මේ වනවිට විවිධ කර්මාන්තශාලා වසා දමා ඇත. චීනයේ අක්‍රියත්වය මුළු ලෝකයටම තර්ජනයක් බවට පත්වී ඇත. චීනයෙන් සේවාවන් ලබාගන්නා ලොව විවිධ ආයතනද මේ වන විට වැසී ඇත. චීනයට සබැඳි ගුවන් සේවා අත්හිටුවා ඇති අතර චීනය හරහා යන නාවික ගමන්ද සියයට අනූවක් නතර වී ඇත. ලෝක ජනගහනයෙන් පහෙන් එකක් වූ චීන ජනතාව නිසා ලෝක ආර්ථිකයේද පහෙන් එකක් ඔවුන් දරා සිටිති. එම කොටස ඇද වැටීම හේතුවෙන් ලෝකය පුරා දැවැන්ත ආර්ථික අහේනියක් සිදුවීම වැළැක්විය නොහැකිය.

ඒ වගේම චීනය ලෝකය පුරාම විවිධ ආයෝජන සිදුකරන රටකි. එම ආයෝජන වල ඇද වැටීමක් තාවකාලිකව හෝ සිදුවීම නොවැලැක්විය හැකිය. ඒ තුළින් ඒ ඒ රටවල් විශාල පසුබෑමකට ලක්වෙයි. ලොව පුරා පවතින කොරෝනා බිය හේතුවෙන් ජනතා



කඩිනමින් ගොඩනැගෙන නව රෝහල

සංසරණය සීඝ්‍ර ලෙස පහළ වැටීම හේතුවෙන් ගුවන් සමාගම් ගුවන් තොටුපලවල් සංචාරක හෝටල් ආදියට අත්වන පාඩුව සුළු පටු නොවේ. ඒ විතරක් නොව ඒ මත යැපෙන සෘජු හා වක්‍ර රැකියා දිනෙන් දින කඩා වැටීම සිදුවෙයි. මෙය අප රටට පමනක් සිදුවන්නක් නොවේ. ලොව දුප්පත් පොහොසත් සෑම රටකටම බලපාන අතර දරාගැනීමේ ශක්තියට සාපේක්ෂව ඇද වැටීම සිදුවෙයි.

මෙම වෛරසය පිළිබඳව පුරෝකථන සිදුකරන විශේෂඥයන් පවසන්නේ වර්ධන වේගය 60% ක් බවය. නිසි පරිදි මේ සඳහා සුදුසු ඖෂධයක් හෝ මෙම වෛරසය පාලය කිරීමට වැඩ පිළිවලක් සකස් නොවුණහොත් ලෝක ජනගහනයෙන් 60% ක් පමන විනාශවීමේ ඉඩකඩ ඇති බවය. එසේ වුවහොත් ලෝකය හිස් මුඩු බිමක් වනු ඇත.

මෙසා විශාල විනාශයක් සිදු කරන වෛරසයක් එකවර ලෝකයට මතුවූයේ කෙසේද යන්න තාම ප්‍රශ්නයකි. මේ පිළිබඳව විවිධ කටකතා මතුවෙමින් පවතින අතර ඒ පිළිබඳව නිශ්චිත නිගමනයක් තාම එළිදක්වා නැත.

කෙසේ වෙතත් මනුෂ්‍ය චර්යාවේ වැරදි හේතුවෙන් මෙවැන්නක් සිදුවන්නට ඇතැයි අනුමාන කළ හැක. විශේෂයෙන් මේ ව්‍යසනයෙන් වැඩිපුරම මරණයට පත් වන්නේ ශරීරික වශයෙන් දුර්වල වූවන්ය. වයසින් වැඩි අය කුඩා ළමුන් මෙයට ගොදුරු වෙයි. ශරීර ශක්තිය ඇති අය ගේ ශරීරය තුළින්ම ප්‍රතිශක්තිය ඇතිවීම තුළින් මෙම රෝගය සුවපත් වේ. කෙසේ හෝ කළ යුත්තේ මෙහි ව්‍යාප්තිය මර්ධනය කිරීමයි. ඒ සඳහා චීනය උපරිම ශක්තියෙන් එයට මුහුන දෙමින් සිටී. චීනය ඇතුලු ලොව පුරා රටවල් මේ සඳහා සුදුසු ඖෂධ නිපදවීමේ කාර්යයේ යෙදී සිටිති.

02 පිටුවෙන්....

## ලොක් ඩවුන් නවකතාව......

එය එස් සිදුවුවත් පීටර්ට තමා එවැනි පොතක් ලියූ බවට අදහසක් වත් පහළ වුයේ නැත. ඒ අතර පසු ගිය දිනක ඔහුගේ ට්විටර් මිතුරෙකු පීටර්ට යෝජනා කොට ඇත්තේ "මේ ලොක් ඩවුන් එක ගැන පොතක් ලියන්න අදහසක් නැද්ද" යනුවෙනි.

ඒ මොහොතේ පීටර්ට මතක් වූයේ තමා මීට වසර 15 ට පෙර ලියූ ලොක් ඩවුන් පොතය. පීටර් වහාම සිය පොත් ප්‍රකාශකට ඇමතුමක් ගෙන තමාගේ ඉවත දැමූ පොත ගැන සඳහන් කළේය. ප්‍රකාශකයාත් විශ්මයට පත්වූයේ ඒ පිළිබඳ මතකය අලුත් වීම නිසාය.

ප්‍රකාශකයා වහ වහා පොත මුද්‍රණය කිරීමට කටයුතු සූදානම් කළේය. මෙම ආරංචිය සැලවීමත් සමගම ඇමරිකාවේ සී.එස්.එන් පුවත් සේවය ස්කොට්ලන්තයේ සිටින පීටර් සමඟ රූපවාහිනී වැඩසටහනක් ගෙන ආවේ වීඩියෝ තාක්ෂණය උපයෝගී කරගෙනය.

එහිදී පීටර් කියා සිටියේ "කෝවිඩ් 19" ආවේ වුහාන් වලින් මගේ පොතේ තියෙන වෛරසය මතුවන්නේ ලන්ඩන් වලින් ඒ අතර ලොකු වෙනසක් තියෙනවා. නමුත් ගෝලීය වසංගත තත්ත්වය හා ලන්ඩන් වගේ නුවරක් වැසූ විට ඇති වන බියකරු තත්ත්වය හැකි හැම අයුරින්ම මම පොතේ දක්වලා තියෙනවා. එදා මට හැඟුණ ඒ ස්වභාවය අද ත්‍රාසජනක හා බියකරු අන්දමින් හැමෝම අත්විඳිනවා." පීටර් එසේ කීවේය.

"දැන් මගේ වයස අවුරුදු 60 යි. කොයිඩ් 19 අනුව මමත් ඉන්නේ අවදානම් වයසක. එදා මම ලියපු පොත හැමෝටම විහිළුවක් වුනා. ඒත් අද එය හැමෝම පිළිග න්නවා. ඒ නිසාම පොතට විශාල ඉල්ලුමක් ඇතිවී තිබෙනවා. මේ පොත කොයිතරම් තාත්විකද කියලා මම සිතන්නේ එහි මුද්‍රිත මුල් පොත මට කියවන්න ලැබුණා. මම ලියපු පොත කියවන විටත් මගේ ඇඟ කිළිපොලා යනවා." යනුවෙන් පීටර් මේ රූපවාහිනී සංවාදයේදී කියා සිටියේය.

මේ වන විටත් පීටර් ගේ ලොක් ඩවුන් පොතට ඇත්තේ විශාල ඉල්ලුමකි.


CEYLON SHIPPING LINES
TRAVELS & TOURS
Tel : +94 11 2689500 - 8
Fax : +94 11 2689510
E-mail : csltravels@sltnet.lk
Skype : csltravels
For more details, please click the below link
IATA
ACCREDITED AGENT



# උණුසුම් නොවුණු මැතිවරණ සටන

**ජනාධිපතිවරයාගේ බලතල ප්‍රකාරව පසුගිය මාර්තු 02 දා මධ්‍යම රාත්‍රී 12 න් පසු ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසුරුවා හැරියේය. අප්‍රේල් 25 වන දිනට මහ මැතිවරණය දින නියම කළද කොරෝනා වසංගතය හේතුවෙන් එදිනට පැවැත්වීමට නොහැකි විය. මැතිවරණ කොමිසම මගින් ඔවුන්ට නීතියෙන් ඇති බලතල අනුව අගෝස්තු 05 දිනට මහා මැතිවරණය පැවැත්වීමට අවශ්‍ය සියලු කටයුතු මේ වන විට සූදානම් කර ඇත.**

මෙතෙක් පැවැති දේශපාලන කඳවුරු දෙක නව මුහුණුවරකින් තරඟවදින පළමු මහා මැතිවරණයද මෙය වෙයි. මෙතෙක් පැවති මැතිවරණ වලදී කුඩා පක්ෂ සමූදායක් සමඟ එක්වී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තනි පෙරමුණක් වශයෙනුත් තවත් කුඩා හා සුළු ජාතික පක්ෂ සමූදායක් සමඟ එක්සත් ජාතික පක්ෂය පෙරමුණක් වශයෙනුත් ද්වන්ද සටනක් අරඹිති. මෙවර එම තත්ත්වය නොවේ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බිඳී පොදුජන පෙරමුණ වශයෙන් පක්ෂයක් බිහිවී අනතුරුව එම පක්ෂය මත ගොඩනැගෙන කුඩා පක්ෂ සමූදායක් එක් කඳවුරකය. එක්සත් ජාතික පක්ෂය බිඳී තවත් කුඩා හා සුළු ජාතික පක්ෂ කීපයක් සමග සමගි ජන බලවේගය නමින් තවත් කඳවුරකුත් බිහිවූ අතර ඉතිරි වූ එ.ජා.ප. කුඩා කොටස තනිවමත් වශයෙන් ප්‍රධාන සටන් කරුවන් තරඟ බිමට අවතීර්ණ වී සිටිති. ඒ අනුව ගත්තාම පුද්ගලයින් වශයෙන් නොවුණත් පක්ෂ වශයෙන් මෙම කඳවුරු තුනම මහා මැතිවරණයකට ඉදිරිපත් වන පළමු අවස්ථාව මෙය වෙයි.

සමගි ජන බලවේගය යටතේ සජිත් ප්‍රේමදාස මහතා නායකත්වය දෙන අතර පොදුජන පෙරමුණට මහින්ද රාජපක්ෂ මහතා නායකත්වය ලබා දෙයි. එ.ජා.ප. මෙවර තනිවම අලියා ලකුණ යටතේ තරඟ වදින අතර එම පක්ෂයේ හිටපු මන්ත්‍රීවරුන්ගෙන් 80% ක් පමණ මෙවර තරඟ කරන්නේ සමගි ජන බලවේගයෙනි. උතුරු නැගෙනහිර ප්‍රදේශ සඳහා ටී.එන්.ඒ. පක්ෂය වෙනම පක්ෂයක් වශයෙන් තරඟ කරන අතර ජනතා විමුක්ති පෙරමුණ සංධාන ගතව ලංකාව පුරා තරඟ වදිති. ඊට අමතරව තවත් කුඩා පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් රැසක් තරඟ බිමට අවතීර්ණ වී ඇති අතර පොදුජන පෙරමුණ හා සමගි ජන බලවේගය ප්‍රධාන පක්ෂ දෙක බවට පත්වී ඇත.

කොරෝනා වසංගතය හේතුවෙන් සෞඛ්‍ය නිර්දේශවලට යටත්ව මැතිවරණ ප්‍රචාරණ කටයුතු සිදුවිය යුතු බැවින් මහා පරිමාණ ජන රැළි තහනම් කර ඇත. වෙනදා තිබූ පීඩාකාරී ඝෝෂාකාරී ස්වභාවය පහව ගොස් ඇති අතර තාප්ප බිත්ති ගස් ගල්වල අලවන අඳින පෝස්ටර් මෙවර දක්නට නොමැති වීම ජනතාවට අස්වැසිල්ලකි.

මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය හරහා තම මතවාද ජනතාව අතරට රැගෙන යන දේශපාලන

**මැතිවරණ කොමිසම මගින් ඔවුන්ට නීතියෙන් ඇති බලතල අනුව අගෝස්තු 05 දිනට මහා මැතිවරණය පැවැත්වීමට අවශ්‍ය සියලු කටයුතු මේ වන විට සූදානම් කර ඇත.**

අපේක්ෂකයන් සිය සුපුරුදු වාග් මාලාව හසුරුවති. ඒවායේ පොදු සමාජයට ගත හැකි අලුත් හරවත් දෙයක් ඵලදායක දෙයක් නොමැත.

පොදුජන පෙරමුණ නියෝජනය කරන පාර්ශ්වය මේ වනවිට ආණ්ඩුබලය හොබවන අතර ජනාධිපතිවරයාද නියෝජනය වන්නේ හා ජනාධිපතිගේ ආශිර්වාදය ලැබෙන්නේ එම පක්ෂයටයි. අවසන්වරට පැවැත්වූ ජනාධිපතිවරණයේදී පොදුජන පෙරමුණ ඉදිරියට පැමිණියේය. එහි වාසිය එම පක්ෂයේ අපේක්ෂකයින්ට හිමිව තිබේ.

සමගි ජන බලවේගය හා එ.ජා.ප. ජනාධිපතිවරණය පවත්වන තුරු බලයේ සිටි පිරිස්ය. එවකට එම පාලන ක්‍රමය පිළිබඳව ජනයාගේ එතරම් ප්‍රසාදයක් නොතිබුණි. එම අප්‍රසාදය නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිටි බොහෝ දෙනෙකු පොදුජන පෙරමුණට එක්වුවද කොටසක් එහිම ඉතුරු වූහ.

හිටපු ජනාධිපතිවරයා ඇතුළුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් හිටපු මන්ත්‍රීවරුන් පොහොට්ටුව ලාංඡනය යටතේ පොදුජන පෙරමුණෙන් තරඟ වදින අතර එම කාලය තුළ රටේ ජනයාගේ තිබූ අප්‍රසාදය තරමක් දුරට එලෙසින්ම පවතී. ඒ නිසාමදෝ පොදුජන පෙරමුණේ අපේක්ෂකයන් හා ඒ යටතේම තරඟ වදින ශ්‍රී ලංකා නිදහස් පක්ෂ අපේක්ෂකයින් අතර මත ගැටුම් උග්‍රලෙස ඇති විය. එය එම පක්ෂයට අවාසිදායක ලෙස පවතියි.

එක්සත් ජාතික පක්ෂය හා සමගි ජන බලවේගය අතර ද මත ගැටුමක් පවතී. මෙම පක්ෂ දෙක ඡන්ද වේදිකාවේ ඔවුනොවුන් අතර බලය වැඩිකිරීමට මහන්සි ගන්නා බවත් පැහැදිලිවම දක්නට ලැබෙයි. එයද එම දෙගොල්ලන්ටම අවාසි දායක බව පෙනී යයි.

කෙසේ නමුත් පක්ෂ හා අපේක්ෂකයින් ගෙන් ඡන්ද දායකයාට වෙනදා එල්ල වන දැඩි බලපෑම මෙදා එල්ල නොවෙයි. මෙවර ඡන්දදායකයා නිරීක්ෂකයෙකු ගේ භූමිකාවට පත්ව සිටී. එය ඉතා හොඳ යහපත් සාධනීය තත්ත්වයකි. ඡන්ද අපේක්ෂකයාට ඉතා පහසුවෙන් මධ්‍යස්ථව සිතා තීන්දුවක් ගැනීමේ අවකාශය වෙනදාට වඩා වැඩිය. ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණයකදී සිදුවිය යුත්තේද එයමය.

**පක්ෂ හා අපේක්ෂකයින් ගෙන් ඡන්ද දායකයාට වෙනදා එල්ල වන දැඩි බලපෑම මෙදා එල්ල නොවෙයි. මෙවර ඡන්දදායකයා නිරීක්ෂකයෙකු ගේ භූමිකාවට පත්ව සිටී. එය ඉතා හොඳ යහපත් සාධනීය තත්ත්වයකි. ඡන්ද අපේක්ෂකයාට ඉතා පහසුවෙන් මධ්‍යස්ථව සිතා තීන්දුවක් ගැනීමේ අවකාශය වෙනදාට වඩා වැඩිය. ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණයකදී සිදුවිය යුත්තේද එයමය.**

ප්‍රධාන පක්ෂය වූ එ.ජා.ප. බෙදීමත් ආසන්න වශයෙන් පැවති ජනාධිපතිවරණයේ ජයග්‍රහනයත් අලුත් චරිතයක් වශයෙන් ජනාධිපති ධුරයට ගෝඨාභය රාජපක්ෂ මහතා පත්වීමත් ආණ්ඩු පක්ෂයට ප්‍රධාන වශයෙන් වාසි සහගත වෙයි.

පෙර පැවති ආණ්ඩුවේ බහුතර මන්ත්‍රීධුර සංඛ්‍යාවක් හා ප්‍රධාන සුළුජාතික පක්ෂ සමගි ජන බලවේගය වටා ඒකරාශි වීම එම පක්ෂයට වාසි සහගත වෙයි.

දීර්ඝ කාලයක් රට පාලනය කළ මෙන්ම ජනතාවගේ මතකයෙන් දුරස් නොවන පක්ෂයක් වශයෙන් එ.ජා.ප. අලියා ලකුණ යටතේම තරඟ වැදීම එම පක්ෂයට ඇති වාසියකි.

මේ සියලු කරුන සම්පිණ්ඩනය වීමෙන් පසු පොදු ජන ඡන්ද දායකයා ගනු ලබන තීන්දුව අවසාන තීන්දුව වන අතර එය කෙසේ වේද යන්න අපට දැනට නිගමනය කළ නොහැක.

සෑම පක්ෂයකින්ම මෙවර අලුත් මුහුණු යම් ප්‍රමාණයක් ඡන්දයට පැමිණ තිබීමත් එක්තරා යහපත් පැත්තක් වනු ඇත.

මැතිවරණ පිටියේ ඇල් මැරුණු ස්වභාවයක් කොරානා වසංගතයේ බලපෑමත් නිසා ඡන්දපොළට යන ඡන්ද දායක ප්‍රතිශතයේ අඩුවීමක් සිදුවීමට බොහෝ දුරට ඉඩ ඇත.




# කොතැනක සිටියත් දෙසිතට සැනසිල්ලක්


## එතෙර උපයන මුදල් සැණෙකින් මෙතෙරට

- ශ්‍රී ලංකාවේ ඕනෑම බැංකුවක් වෙත සම්පත් ඊ-රෙමිටන්ස් හරහා මුදල් යැවීමේ හැකියාව
- මුදල් ලබා ගැනීමට දින 365ම විවෘත සුපිරි ශාඛා සමඟ දිවයින පුරා ව්‍යාප්ත සම්පත් බැංකු ශාඛා ජාලය
- සම්පත් බැංකු ගිණුමකට මුදල් යැවීමේදී දීප ව්‍යාප්ත ATM ජාලය මගින් එවෙලේම මුදල් ලබාගැනීමේ හැකියාව
- ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට ඔබේ මුදල් ලංකාවේ ඔබට අවශ්‍ය ජංගම දුරකථනයකට යැවීමේ පහසුකම
- මුදල් ලංකාවට ලැබුණු සැණින් සම්පත් බැංකුවෙන් SMS පණිවිඩයක්
- ඉතුරුම් සඳහා ඉහළ පොලී අනුපාත
- නිවාස ණය පහසුකම්

Sampath
e remittance service
රෙමිටන්ස් සේවාව ரெமிட்டன்ஸ் சேவை

0773933833 www.sampath.lk

# සෞඛ්‍යාරක්ෂිතව පවත්වන ලංකාවේ පළමු මැතිවරණය



ලොව දරුණුතම වසංගතයක් ලොව පුරා පැතිර යන අවදියක ලංකාවේ පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමට සිදුවී ඇත. මේ තත්ත්වය අපට පමණක් නොව ලොව වෙනත් රටවල් කීපයකට ද සිදුකිරීමට සිදුවිය. පාර්ලිමේන්තුව නොපවත්වා රටේ ඉදිරිග මන ඉදිරියට ගෙනයෑමට ව්‍යවස්ථානුකූල බලයක් ජනාධිපතිට හෝ රාජ්‍ය නිලධාරීන්ට නොමැත. ඒ නිසා එය පැවැත්විය යුතුමය.

නමුත් කොරෝනා උවදුර මේ සඳහා ප්‍රබල අභියෝග යකි. කොරෝනා වෛරසය ශරීරගත නොකරගෙන හා අන් අයට බෝවීමද වළක්වා ගනිමින් ඡන්ද අපේක්ෂකයින් සිය ප්‍රචාරණ කටයුතු සිදුකිරීමත් මැතිවරණ කොමිසම මැතිවරණය පැවැත්වීමත් සිදුකළ යුතුය. මේ සඳහා වෛද්‍ය උපදෙස් අකුරටම පිළිපැදිය යුතුය.

සාමාන්‍යයෙන් මෙම වෛරසය නොවැළදීම සඳහා පොදු මහත් සමාජයම පිළිපැදිය යුතු අනුගමනය කල යුතු ක්‍රමවේදයන් 9 ක් වෛද්‍ය මණ්ඩලය මගින් ප්‍රකාශයට පත්කර ඇත.

ඊට අමතරව මැතිවරණ කටයුතු වෙනුවෙන් දේශපාලන පක්ෂ හා ඒ ඒ අපේක්ෂකයින්ද එවැනි කටයුතු සඳහා සහභාගිවන ඡන්ද දායකයින්ද අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙතක් ඇත.

මෙම ක්‍රමවේදය අනුග මනය නොකිරීම සමාජයේ මෙම වෛරසය ව්‍යාප්ත වීමට හේතුවක් සේම නීතියෙන් දඬුවම් ලැබිය හැකි වරදක් ද වනු ඇත.

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් 2020 ජූලි 17 වන දින අති විශේෂ ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදී. එම නිවේදනයට අනුව යම් අපේක්ෂකයෙකු යම් ප්‍රදේශයක සිය මැතිවරණ ප්‍රචාරණය රැස්වීමක් පවත්වන්නේ නම් එය ආරම්භවීමට පැය 24 ට ප්‍රථම එම ප්‍රදේශයේ සෞඛ්‍ය කාර්යාංශය වෙත වාර්තා කළ යුතුය. එම රැස්වීමට තුන්සීයකට නොවැඩි පුද්ගලයින් පිරිසක් සහභාගි කරවා ගත යුතු අතර අදාල පක්ෂයේ හෝ කණ්ඩායමේ නායකයා එයට සහභාගි වන්නේ නම් එම සංඛ්‍යාව 500 දක්වා වැඩිකර ගත හැක.

මෙසේ පවත්වන රැස්වීමේ අනුගමනය කරන කොන්දේසි නම් එයට සහභාගි වන සෑම අයෙකුගේ ම හැඳුනුම්පත් අංක දුරකථන අංක ඇතුළුව අනන්‍යතාව සහතික කරගත යුතුව ඇත.

එසේම එම පැමිණෙන සැමට අත් පිරිසිදු කරගැනීමට සබන් ජලය හෝ විෂබීජහරණ යන්ත්‍ර ප්‍රමාණවත් පරිදි සැපයිය යුතුය. එහි සිටින සියල්ලන් මුහුණු ආවරණ පැළඳ සිටිය යුතුය. සෑම අයෙකු අතරම මීටරයක දුර පරතරය තබා ගැනීමට වගබලා ගත යුතුය. කථිකයින් විසින් මයික්‍රපෝන් භාවිතයෙන් පසු ඊළඟ කථිකයා එය භාවිතා කිරීමට ප්‍රථම විෂබීජහරණය කළ යුතුය.

මේ මැතිවරණ කාලසීමාවේ නිවෙස්වලට ගොස් ඡන්ද දායකයින් දැනුවත් කිරීම සාමාන්‍ය ක්‍රමවේදයකි. ඒ සඳහා ද නීති රෙගුලාසි පනවා ඇත.

නිවෙසකට යන පිරිස පස්දෙනෙකුට නොවැඩි විය යුතු අතර එම අය මුහුණු ආවරණ පැලඳ මීටරයක දුර තබාගෙන ගෙයින් ගෙට යෑම සිදුවීම අනිවාර්ය වේ. ඊට අමතරව එම නිවෙස්වලට අත් පත්‍රිකා හෝ වෙනත් ලියවිලි හෝ යම් දෙයක් දෙන්නේ නම් ඒ දෙන කෙනා පළමුව විෂබීජ නාශකවලින් දෙඅත් පිරිසිදු කරගැනීමෙන් පසු එය සිදු කළ යුතුය.

ඒ ඒ අපේක්ෂකයින් විසින් සිය මැතිවරණ කාර්යාල පවත්වාගෙන යෑමේදී ද අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙතක් ඇත. එම කාර්යාල තුළ කටයුතු කරන අය මීටරයක දුර තබාගෙන සිටිය යුතුය. කාර්යාලයට ඇතුළුවන ඕනෑම අයෙක් එහි ඇතුල් වන විට අත් සෝදා පිරිසිදුව පැමිණිය යුතුය. කාර්යාලය තුළ දුම්පාන ආකාරයක හෝ මත්ද්‍රව්‍ය භාවිතා නොකළ යුතුය. එම කාර්යාල තුළ විවිධ වූ ක්‍රීඩාවල යෙදීමද සපුරා තහනම් වේ.

ඡන්දය පාවිච්චි කිරීම සඳහා ඡන්ද පොලට යාමේදී භාවිතා කළ යුතු ආරක්ෂිත වැඩ පිළිවෙලක් ඇත.

ඡන්ද පොළට පිවිසි විට පළමුව දෙඅත් සබන් හෝ විෂබීජ හරණ දියරවලින් පිරිසිදු කර ගතයුතුය.

පුද්ගලයින් දෙදෙනකු අතර දුර මීටරය බැගින් තබාගත යුතුය. සෑම විටම සේවයේ යෙදී සිටින අයත් පිටතින් පැමිණෙන ඡන්ද දායකයනුත් මුහුණු ආවරණ පැළඳ සිටිය යුතුය.

ප්‍රජාතන්ත්‍රවාදීව ඡන්දය පාවිච්චිකිරීම සෑම පුරවැසියෙකුගේම වගකීමකි. ඒ වගකීම ඉටුකිරීම අප සතුය. ඒ අනුව ඔබ කැමැති දේශපාලන පක්ෂයකට හා යහපත් යුක්තිගරුක නීති ගරුක දැන උගත් අයෙකුට ඔබගේ මනාප ලබා දිය යුතුවාසේම පවතින වසංගත තත්ත්වයෙන් ආරක්ෂාවීමද ඔබගේ යුතුකමකි. මෙම වසංගතයෙන් තමා ආරක්ෂාවෙමින් අන් අයවද ආරක්ෂා කරමින් මැතිවරණයට මුහුණ දෙමු.












අඩුම මිල අපෙන්

ක්ෂණික ඇමතුම්

අසේල අනුරාධ 054-712 0564
අජන්ත කුමාර 054-712 0565
නිරෝෂන් 050-712 0574

හිරු කාගෝ

වගකීමකින් | කඩිනමින් | සුරක්ෂිතව

ඔබ මහන්සියෙන් උපයාගත් බඩු භාණ්ඩ විශ්වාසවන්තව මව්බිමට යැවීම සඳහා ඔබ තෝරාගත යුතු එකම කාගෝ සේවය හිරු කාගෝ

ශාඛා:
කොළඹ, පෑලියගොඩ, වත්තල, දඹුල්ල, නුවර සහ අඩලච්චේන්නායි

هيرو مون لخدمات الشحن ش.ذ.م.م.
HIRU MOON CARGO SERVICES L.L.C I TEL.: 04 - 28 95 75
OFFICE NO. 108, AL HABTOOR COMPLEX, RAS AL KHOR AL AWIR, DUBAI, U.A.E.



# ලොවම බිලිගත් කොරෝනා



මරණ සංඛ්‍යාව ලක්ෂ දෙක ඉක්මවිය. කොවිඩ් 19 හෙවත් කොරෝනා රෝගය ලොව පුරා ප්‍රචලිත වී ඇති මේ අවස්ථාව වන විට සමස්ත ලෝකය අකර්මන්‍ය වී ඇත. ඇමරිකා එක්සත් ජනපදයේ මිය ගිය සංඛ්‍යාව 55,000 ආසන්නය.

චීනයේ වුහාන් ප්‍රාන්තයෙන් මතුවූ මෙම වසංගත තත්ත්වය අද වන විට රටවල් හා ස්වාධීන කලාප 210 ක් දක්වා ව්‍යාප්ත වී ඇත. මීට පෙර ලෝකයට ඇතුළු වූ සාර්ස් හා එබෝලා වැනි රෝග තත්ත්වයන් හා සසඳන විට කොරෝනා අඩු අනතුරක් පෙන්නුවත් ව්‍යාප්තවීමේ වේගය අතින් සෙසු වසංගතයන්ට වඩා සිය ගුණයක් ඉදිරියෙන් සිටියි.

සාමාන්‍ය උණ කැස්ස සෙම්ප්‍රතිශ්‍යාව වැනි රෝග ලක්ෂණ මතුවන මෙමගින් නිසි ලෙස ශරීරයේ ප්‍රතිශක්තිය වර්ධනය නොවුණහොත් එය නිව්මෝනියා තත්ත්වයට පත්ව රෝගියා මරණයට පත්වෙයි. ඉතාලිය ස්පාඤ්ඤය වැනි රටවල දිනකට මරණ 800 ඉක්මවා ගියහ. ඇමරිකාවේ දිනකට මරණ 500 - 2000 ඉක්මවා ගිය අතර 2500 පැන්නු අවස්ථාද බොහෝ විය.

මෙම රෝගයේ තිඹිරිගෙය වූ චීනයේ ආසාධිත හා මිය ගිය ප්‍රමාණ පිළිබඳ බටහිර රටවලට වඩා අඩු සංඛ්‍යා ලේඛන පෙන්නුම් කරයි. චීනයේ සංඛ්‍යා පිළිබඳ ලොව බොහෝ රටවල් සැක සංකා උපදවා සිටිති.

මෙම වෛරසය පිළිබඳව ද බොහෝ දෙනා විවිධ වූ මත පළ කරති. සමහරු ප්‍රකාශ කරන්නේ මෙය ජීව විද්‍යාත්මක අවියක් වශයෙනි. යුධමය අවස්ථාවක නවීන තාක්ෂණික අවිවලින් පහර දෙනවාට වඩා මෙවැනි වෛරසයක් සතුරු රාජ්‍යයක ව්‍යාප්ති කිරීම මගින් එම රටම අකර්මන්‍ය කිරීමේ හැකියාව සඳහා නිපදවන ලද්දක් බවයි. එසේ නිපදවූ මෙම වෛරසය අතපසුවීමක් මගින් පරිසරයට නිරාවරණය වීම මගින් සිදුවූ විපතක් වශයෙනි.

තවත් අදහස් දක්වන අය පවසන්නේ චීනය විසින් යම් විටක මෙවැනි ජීව විද්‍යාත්මක ප්‍රහාරයකට ලක්වූවහොත් එයට මුහුණ දීම සඳහා තම රටට හැකියාව ඇද්දැයි අත්හදා බැලූ අවස්ථාවක් වශයෙනි. චීනයේ ප්‍රකාශකයින් ඍජුවම ඇමරිකාවට චෝදනා කරමින් ප්‍රකාශ කළේ ඇමරිකානු සොල්දාදුවන් පිරිසක් මගින් මෙම වෛරසය චීනයට බෝවූ බවයි.

තවත් අයෙකුගේ අදහස වූයේ මෙය බැක්ටීරියාවක් හා වෛරසයක් යන දෙකම සංකලනය කොට විද්‍යාගාරයක් තුළ නිපදවූවක් බවත් එය එසේ කලේ ජලයේ දියවී ඇති ඛනිජ තෙල් වෙන්කිරීම සඳහා අවශ්‍ය රසායනයක් නිෂ්පාදනය කිරීම සඳහා බවත් එය අනපේක්ෂිත ආකාරයෙන් පරිසරයට එක් වූ බවත්ය.

කෙසේ නමුත් මින් එක් දෙයක් පැහැදිලිය. එනම් මෙතෙක් ලෝකයේ නොතිබුණ වෛරසයකි. එය ස්වභාවයෙන් හටගන්නා හෝ කෘතිමව නිපද වූවා විය හැක. එසේත් නොමැති නම් වෙනස් නිෂ්පාදනයක අතුරු ඵලයක් වශයෙන් පරිසරයට එක්වූවා විය හැක. ඒඩ්ස්, එබෝලා, සාර්ස් වැනි වසංගත ද මෑත යුගයේ පරිසරයට එක්වූ වෛරස් වර්ගය.

**සාමාන්‍ය උණ, කැස්ස, සෙම්ප්‍රතිශ්‍යාව වැනි රෝග ලක්ෂණ මතුවන මෙමගින් නිසි ලෙස ශරීරයේ ප්‍රතිශක්තිය වර්ධනය නොවුණහොත් එය නිව්මෝනියා තත්ත්වයට පත්ව රෝගියා මරණයට පත්වෙයි.**

වෛරස් ආසාධනය සඳහා නිශ්චිත ඖෂධ නිෂ්පාදනය කිරීමට වර්තමාන වෛද්‍ය විද්‍යාව තාම දියුණු නැත. ඒ නිසා තව බොහෝ කාලයක් මෙම වසංගතයෙන් ලෝක වාසීන් පීඩාවට පත්වනු ඇත.

රෝගය හඳුනාගැනීමත් සමගම ලොව පුරා දියුණු රටවල ජීව විද්‍යාඥයන් ගේ මුලු කාලයම මේ පිළිබඳව අවධානය යොමුවී ඇත. විවිධ අත්හදා බැලීම් සිදුකරමින් මෙම රෝග යේ ස්වභාවයන් ඒ සඳහා ප්‍රතිකර්මයකුත් සෙවීමේ දැඩි වෙහෙසක් දරන පිරිස් සිටිති.

මේ අතර ජපානය, ඇමරිකාව වැනි රටවල් ඒ සඳහා ආසන්න වශයෙන් ක්‍රියාත්මක වන ප්‍රතිපත්ති සොයා ගනු ලැබුවද ඒවායේ එතරම් සාර්ථකත්වයක් නොතිබුණි. මේ අවස්ථාවේ කොරෝනා වෛරසය සඳහා නිසි ඖෂධයක් සොයා ගත හැකි වුවහොත් එම පුද්ගලයා හෝ රට මේ සියවසේ විශිෂ්ටයා බවට පත්වනු ඇත.

වෛද්‍ය නිගමනවලට අනුව මේ සඳහා අවශ්‍ය වන්නේ තම තමන්ගේ ශරීරවල පවතින ප්‍රතිශක්තිකරණ ශක්තියයි. යම් රෝග යකට ඔරොත්තු දීම සඳහා ශරීරය තුළින් හටගන්නා ප්‍රතිශක්තියයි.

රෝග ව්‍යාප්තිය දෙස බැලීමේදී බටහිර රටවල ජනයාට මෙම ශක්තිය අඩු බව පැහැදිලිය. ඒ නිසා එම රටවල ආසාධිතයින් මිය යන සංඛ්‍යා ඉහළ ගොස් ඇත.

අධික සීතල ප්‍රදේශ වූ ඇන්ටාටික් ප්‍රදේශයට මෙම රෝගය ව්‍යාප්තවී නොමැත. උෂ්ණ කලාප වූ ආසියාවත් මැද පෙරදිගත් රෝග ව්‍යාප්තියේ වේගය අඩුවී ඇත. අප්‍රිකාවටද පැතිර ඇති නමුත් ව්‍යාප්තවීමේ වේගය මන්දගාමීව සිදුවෙයි.

යුරෝපය හා ඇමරිකානු කලාපයේ පැතිරීමේ වේගවත් බව දෛනික සංඛ්‍යා ලේඛන තුළින් පෙන්නුම් කරයි.


කටාර් හී සේවය කරන ඔබ වෙනුවෙන් ශ්‍රී ලංකාවේ සිටින
ඔබගේ නෑ හිතවතුන් වෙත දැන්
ඉතා ඉක්මනින් - සුරක්ෂිතව - විශ්වාසවන්තව
අඩුම මිලට
භාණ්ඩ ප්‍රවාහනයට
සුවිශේෂි සේවා රැසක් සමගින්
ගල්ෆ් ෆැල්කන් සේවය
Gulf Falcon Services Co.
සිලෝන් ෂිපින් ලයින්ස් සමාගම
CEYLON SHIPPING LINES LTD.
Door to Door
Cargo to Sri Lanka
IN QATAR
Gulf Falcon
Services Company (W.L.L.)
AGENT IN SRILANKA
CEYLON
SHIPPING LINES LTD.
දැන්ම අමතන්න.......
77885503
77884458
77883866
කටාර් රාජ්‍යයෙ
සිට දිවයින පුරා
දොරින් දොරට
භාණ්ඩ නිදහස්කර ගැනීමේ මධ්‍යස්ථාන:
කොළඹ • නුවර • අට්ටාලච්චේනේ
Colombo • Kandy • Addalaichenai
C.R. No.: 31869, P.O. Box: 7079, Doha - Qatar, Tel.: 44869723, E-mail : gulffalconcargoqatar@gmail.com



# ආතරයිටීස් රෝගයෙන් මිදීමට ආයුර්වේදයෙන් උපදෙස්

වර්තමානයේ ජීවන චක්‍රය තුළ ලෙඩ රෝග වැළඳීමේ ප්‍රවණතාවය ද ඉහළයි. ඒ අතර වඩාත් කතාබහට ලක්වන රෝගයන් අතරට රූමැටික සන්ධි ප්‍රදාහය අයත් වේ.

ලෝක ජනගහනයෙන් 0.5 - 1 ට ආසන්න ප්‍රතිශතයක් මෙන්ම ශ්‍රී ලංකාව තුළ නිදන්ගත රෝගී ජනගහනයෙන් 11 කට ආසන්න සංඛ්‍යාවක් මෙම රෝගයට ගොදුරු වී සිටීම මේ රෝගයේ දරුණු බව විදහාපායි.

අස්ථි අතර පවතින සන්ධිවල ඇතිවන ප්‍රදාහක තත්ත්වයන් නිසා ඇතිවන මේ රෝගයෙහි ප්‍රධාන ලක්ෂන ලෙස සන්ධි ඉදිමීම, සන්ධි වල ඇතිවන වේදනාව සහ තද ගතිය, උණ, ආහාර අරුචිය වැනි ප්‍රධාන ලක්ෂණ දැක්විය හැකිය.

නිසි අවස්ථාවේදී රෝගය හඳුනාගෙන ප්‍රතිකාර නොකිරීම නිසා



කල්ගතවීමේදී අස්ථිවල ඇදවීම, විකෘතිතා සහ සිරුරේ වෙනත් අවයවයන් (ඇස් / හෘදය ආදී) වලටද හානි වීමට ඉඩ තිබේ.

මෙම රෝගය සඳහා සාර්ථක ආයුර්වේද ප්‍රතිකාර පැවැතියද රෝගය මූලික අවස්ථාවේදීම ඒ සඳහා යොමුවන රෝගීන් පිරිස ඉතා අඩුය. එබැවින් මේ රෝගයෙහි ආයුර්වේද ප්‍රතිකාරවල සාඵල්‍යතාවය අත්විදිනුයේ ඉතා අඩු ප්‍රමාණයකි.

**සන්ධි ආශ්‍රිතව බහුලවම ඇතිවන රෝග තත්වයන් 03 ක් ආයුර්වේදයෙහි දැක්වේ. ඒවා සන්ධිගත වාත, ආමවාත, වාතරක්ත නම්වේ.**

මේ රෝගවලින් ආමවාත රෝගය රූමැටික සන්ධි ප්‍රදාහයට සමපාත කළ හැක. ආමයෙන් දූෂිත වාතය යන අරුතින් මේ රෝගයට ආමවාත නම් ලැබෙන අතර එයට හේතුව විමසා බලමු.

ආයුර්වේද වෛද්‍ය ක්‍රමයට අනුව සිරුරේ සියලු ක්‍රියාවන් පාලනය කරනුයේ වාත / පිත්ත / කප යන ත්‍රිදෝෂය මගිනි. මෙම දෝෂයන් සමබරව සිරුර තුළ පවතින විට සිරුරේ නිරෝගී බව රැකේ. එම සමබරතාවයෙහි සිදුවන යම් වෙනසකින් රෝගයක් ඇතිවේ.

මෙම රෝගය හටගැනීමේ මූලය වන්නේ ඉහත කී දෝසයන්ගේ සමතුලිත බව බිඳී යාම නිසා ආහාර ජීර්ණ පද්ධතිය ආශ්‍රිතව ඇතිවන සංකූලතාවයකි. අප ගන්නා ආහාර ජීර්ණය කිරීමෙන් පසු එම ආහාරවල ඇති පෝෂක කොටස් සිරුරට අවශෝෂනය කරනුයේ ආහාර ජීර්ණ පද්ධතිය මගිනි.

නමුත් මේ ක්‍රියාව නිසි පරිදි සිදු නොවීම නිසා අර්ධ වශයෙන් ජීර්ණයට ලක්වූ ආහාර, ජීර්ණ පද්ධතිය තුළ එක්ර ැස් වීමෙන් ආමය නම් විෂ පදාර්තය නිපදවෙයි. වාත දෝෂය හා එක්වන එම ආමය රුධිරයට එක්වී ඒ හරහා සිරුරේ අස්ථි සන්ධි කරා ගොස් ඒවායේ තැන්පත් වී ආමවාත රෝගය ඇති කරයි.

මෙහිදී අභ්‍යන්තරව ලබාදෙන කෂාය / කල්ක / පෙති / වැනි ඖෂධ වලට අමතරව ස්ථානීයව සිදුකරන ඖෂධීය තෛල සම්බාහන / ස්වේදන / පත්තු / ආලේප වැනි ප්‍රතිකාරද රෝගය සුව කිරීම සඳහා විශාල දායකත්වයක් ලබා දේ.

රෝගයට මූලිකවම හේතුව වූ ආමය නම් විෂ පදාර්ථය ඖෂධ මගින් පැසවා (ජීර්ණයට ලක්කර) මලපහ සමඟ ඉවත් කිරීමෙන් රෝග ලක්ෂණ බොහෝමයක් පහව යයි.

ප්‍රතිකාර කාලසීමාව තුළ රෝගියාගේ ආහාර විහරණ රටාව ක්‍රමවත් කිරීම සඳහා වෛද්‍ය උපදෙස් ලබාදේ. විශේෂයෙන් නැවතත් ආමතත්වයක් ඇති නොවීම සඳහා ආහාර රටාව සකසා ගැනීමට රෝගියා උනන්දු විය යුතුයි.

එමෙන්ම දූෂිත වාත දෝෂ ප්‍රමුඛ අනෙක් දෝෂයන් සමතුලිත කිරීම සඳහා වස්ති ආදී වූ ප්‍රතිකාර සාර්ථක ලෙස භාවිත වේ.

රෝගය නිසා අක්‍රමවත් වූ සන්ධි චලන ක්‍රමවත් කිරීම සඳහා යෝග ව්‍යායාමවල යෙදීම අතිශය ප්‍රතිඵලදායකයි.


රෝගය නිසා දුර්වල වූ සිරුර ශක්තිය නැවත ප්‍රතිස්ථාපනය කර ප්‍රතිශක්තිය වර්ධනය වීම සඳහා ප්‍රතිකාරවල අවසන් කාල සීමාව තුළදී ඖෂධ යෙදීම සිදු කරනු ලබයි.

අයුර්වේදයේ ඖෂධ විශාල ප්‍රමාණයක් පවතින අතර රෝගියාගේ දෝස තත්වය රෝගය පවතින අවස්ථාව වැනි දෑ සලකා බැලීමෙන් පසුව වෛද්‍ය උපදෙස් හා ප්‍රතිකාර නිර්දේශ කරනු ලබයි.

වැදගත්ම දේ නම් රෝගයට නිසි ප්‍රතිකාර ලබා ගැනීමයි. ප්‍රතිකර්ම සඳහා රෝගය මූලික අවස්ථාවේදීම ලබා ගැනීම හා ඒ ප්‍රතිකාර නිසි අයුරින් ලබා ගැනීම සහ ඔබේ ජීවන චක්‍රය යහපත් කරගැනීම තුළින් නිරෝගී සුන්දර ප්‍රීතිමත් දිවියක් ඔබට හිමිකර ගත හැක.

## රෝගයේ මූලික අවස්ථාවේදී පහත රෝග ලක්ෂණ දැකිය හැකිය.

- සිරුරේ විවිධ ස්ථානවල ඇතිවන වේදනාව (අංගමර්ද)
- ආහාර අරුචිය • අධික පිපාසාව • අලස බව • උණ
- අජීර්ණ ලක්ෂන (උදර වේදනාව, මල බද්දය, විටින් විට බඩ පුරවා දැමීම)
- සන්ධි වල තද ගතිය
- සන්ධි වල ප්‍රදාහාරාත්මක ලක්ෂණ (සන්ධි ඉදිමුම / රතු වීම, උෂ්ණත්වය වැඩිවීම, අධික වේදනාව)
- නිතර මුත්‍රා පිටකිරීමේ අවශ්‍යතාව
- අධිකව කටට කෙළ ඉනීම • ඔක්කාරය / වමනය



**උපදෙස් ගම්පහ වික්‍රමාරච්චි අයුර්වේද වෛද්‍ය ආයතනයේ මූලධර්ම අධ්‍යානාංශයේ ආයුර්වේද වෛද්‍ය දිනූෂා බාලසූරිය**




**Refreshingly easy options of sending your personal effects & gift boxes**

**AUSTRALIA to SRI LANKA**

**Collect from any of our Bonded Warehouses**
**COLOMBO-KANDY-ADDALAICHENAI**
**Or**
**Delivered to your door step Island wide.**

Head Office / Warehouse
10/2, Dingley Avenue, Dandenong, Victoria 3175
Branches : NSW, ACT, SA, WA. QLD
Phone : +61 3 9792 9877 Email : info@ceylonshippinglines.com.au

# වැදූ මව ගේ සහ හැදූ මවගේ දරු සෙනෙහස කියන "සුනාමී"

**2004 වසරේ දෙසැම්බර් 26 වනදා ලක් ඉතිහාසයේ දරුණුතම ස්වාභාවික විපත ලක් මවට උරුම කර දුන්නේ ජාති, ආගම්, කුල බේද, සීමා මායිම් පදනම් කරගෙන පැවති තිස් අවුරුදු යුද්ධය පවා සොබා දහමේ මැණියන්ට වලංගු නොවන බවට අපට පසක් කර දෙමිනි.**

සුනාමිය සිංහල, දමිළ, මුස්ලිම්, බර්ගර් ශ්‍රී ලාංකික ජීවිත හා විදේශීකයන්ද ඇතුළුව 34000 කට අධික ප්‍රමාණයකට සිය ජීවිත අහිමි කර තවත් දහසකුත් දෙනා හිස් ලූ ලූ අත යවමින් අත් පා අහිමි කළේය. තවත් පිරිසකගේ ජීවිත අවුල් කර තම ආදරණීයයන් එකෙකු හෝ ඩැහැගෙන නැත්නම් එකෙකු පමණක් ඉතිරි කොටය.

චිත්‍රපටයේ නම නිසාවෙන් කෙනෙකුට මෙය සුනාමිය කල ව්‍යාසනය ඉන් දිවි ගලවා ගත් කිහිපදෙනෙකුගේ ජීවිත පිළිබඳව ගෙතුණු කතාවත් යැයි සිතිය හැක. නමුත් මේ කතාවේ ඉන් බොහෝ ඔබ්බට ගිය සුනාමියෙන් පසු සිදුවන සිද්ධි මාලාවක් පදනම් කරගෙන දිග හැරෙන ගැඹුරු අර්තවත් කතාවකි.

දරුවෙකු වෙනුවෙන් මව් දෙපලකගේ අරගලයක්, බර්ටොල් බර්ෂේට් ගේ හුනුවටයේ කතාවෙන් අපි දුටුවෙමු. හුණුවටයේ කතාවේ නූතන පිටපත දිගහැරෙන්නේ සුනාමි චිත්‍රපටය හරහාය.

ත්‍රිකුණාමලයේ කරවල වාඩියකින් ජීවිතය ගැට ගහගන්නා දමිළ පවුලකටත් නුවර සිට පැමිණ ත්‍රිකුණාමලයේ සිරි නරඹමින් සිටි සිංහල පවුලකටත් බියකරු රළ පහර නොසිතු මොහොතක එල්ල වන්නේ දමිළ මවට අඩ හෝරාවකට කලින් තම නිවස තුළ දරු නැළවිලි ගයා නිදිකර තබා ආ තම තෙහැවිරිදි දියණිය සුවසේ නිදන අයුරු සිහි කරවමිනි.

එක් නිමේෂයකින් දරු පවුල් දෙකක් හිස් ලූ ලූ අත යැවූ සුනාමිය නවතින්නේ ඉන් එක් කිරිකැටියෙක් සඳහටම සාගර මවට තුරුලු කරගෙනය.

තතු නොදත් දෙමාපියන් තම දියණිය සොයා සුනාමිය වැනසූ නගරය පීර පීරා කරන අරගලය ජය ගන්නේ එක් පවුලක් පමණි. එහෙත් එය තාවකාලිකය.

වැදූ මවකට තම දරුවා හඳුනාගැනීම කිසිම විටක ප්‍රශ්නයක් නොවේ යැයි අපට සිතෙනු ඇත. නමුත් එය වරදින කල ගුරුන් අකුරු වරදා කළ වරදට වඩා ඔබ්බට යයි. මව් පදවියට ඇති ආදරය නිසාවෙන් තම හෘද




සාක්ෂියට එරෙහිව යන්නට මවකට හිත හදාගන්නට පුලුවන්ද හැමවිටම තාර්කිකව ලොව දකින පිය පක්ෂයට චිත්තවේගී මවකට යතාර්තය වටහා දිය හැකිද... පිරිමියෙකුගේ තාර්කික සිත දරු සෙනෙහස ඉදිරියේ ලෝක ධර්මයට එරෙහි නොවන්නට පුලුවන්ද...

දෙමාපියන් තම දරුවන් වෙනුවෙන් බොහෝ කැප කිරීම් කරන්නට පෙළඹෙති. දරුවෙකු වෙනුවට තවත් දරුවෙකු ආදේශ කළ හැකිද... මුලින් වැදූ දරුවාගේ හිස්තැන මකන්නට දෙවියන්ගේ පිහිට වන්නේ තවත් දරුවෙකුගේ ආශිර්වාදය ඒ මව් කුසටම ලබාදෙමින්ද යන්න පිළිතුරු දිය නොහැකි තවත් පැනයකි.

කිරි කළ ලේ වල පින් බලයෙන් නොසිතු මොහොතක වැදූ මවට තම දරු පැටියා මුණගැස්වන්නේ තවත් අවුල් ගොඩකට මව් පිය දරු සියලුදෙනා ඇද දමමිනි.

සැමට සර්ව සාධාරණ නීතිය ලෝක ධර්මයට අනුව තම තීන්දුව ප්‍රකාශ කරත්, මේ පුංචි ජීවිතය මේ ආදරයේ වෙනස කොහොම දරාගන්නද? සාමාජීය පාරිසරික වෙනස කොහොම දරාගන්නද?

මව් - පිය - දරු මේ මහා පටලැවිල්ල විවිධාකාර මිනිසුන් වෙසෙන සමාජය දකින්නේ කෙසේද?...




ආගම, මිත්‍ර - දම්. මිත්‍යා විශ්වාස පාරම්පරික අදහිලි මේ ප්‍රශ්නය විසඳයිද ... නොඑසේ නම් අප කවදත් අසන දකින විදියට අවස්තාවාදී වේද ... නොවිසඳිය හැකි ප්‍රශ්නයක් හමුවේ දෙමාපියන් මේ හැම බලවේගයකම පිහිට පතන එක අරුමයක් නොවෙනු ඇත. එවන් අවස්ථාවකදී මෙය ඔබටද මටද පොදුය.

මව් සෙනෙහසේ සංවේදීකම පිය සෙනෙහසේ දරා ගැනීමේ සීමාව අභියෝගයට ලක් කරන සුනාමියේ ප්‍රධාන චරිත වලට දර්ශන් ධර්මරාජ්, නෙරංජනී ශම්මුගරාජා, බිමල් ජයකොඩි, හිමාලි සයුරංගි පණ පොවන්නේ තම රංගන දිවියේ හිමිවූ මහත්වූ අභියෝගාත්මක චරිත වලට සාධාරණයකට එහා ගිය විශිෂ්ටත්වයක් එක් කරමිනි. මනෝරා වීරතුංග පුංචි දැරිවියගේ රංගනයත් ඉතාම සංවේදී වන අතර එය පුංචිකම අභිබවා යයි.

දත් නොදත් ප්‍රවීණ ආධුනික සෙසු චරිතද අපූර්ව ලෙස මේ කතාවේ රසය ඔප් නංවන්නට වරෙක සංවේදීවද තවත් විටෙක හාස්‍යාත්මකවද දායක වන්නේ අපේ සිතුවිලි ඇදහිලි වලටද ඉඟි පාමිනි.

ශ්‍රී ලාංකීය සිනමාවේ ඇති දැවැන්ත නිෂ්පාදනයක් හරහා නිපැයුනු සුනාමි චිත්‍රපටයේ දෘෂ්‍යය ප්‍රයෝග (visual effects) සිනමා ශාලාවේ ඇති කරන වාතාවරණය නරඹන්නන්හට සැබෑ සුනාමියක භීතිය සිත් වලට කා වද්දනු නොඅනුමානය.

ආචාර්ය සෝමරත්න




දිසානායකයන් සහ රේණුකා බාලසූරිය දෙපලගේ මේ දැවැන්ත මෙහෙයුම වෙනුවෙන් ලේ දහඩිය, කළ කැපකිරීම්, ඇසූ බැනුම් වලට ශ්‍රී ලාංකීය සිනමා ලෝලීන් සාධාරණ පිළිතුරක් ඉහළ ඇගයීමක් ලබා දෙනු ඇතැයි සිතමි. දැනටමත් සුනාමි චිත්‍රපටය DURK ජාත්‍යන්තර චිත්‍රපට උළෙලේදී සම්මාන 4 ක් හිමිවී ඇති බව සඳහන් කරන්නේ සතුටිනි.

ඔබේ ඒකාකාරී ජීවිතයෙන් මිදෙන්නට ශ්‍රී ලාංකික සිනමා හැකියාවන් අත්විඳින්නට EAP මණ්ඩලයේ තිරගත වන හදවත් වල සුනාමිය නරඹන්නට ඔබ සැමට ඇරයුම් කරමි.

මා නැරඹූ හදවත් වල "සුනාමිය" චිත්‍රපටය පිළිබඳ සටහන් මෙසේ අවසන් කරමි. මේ පදවිය ලබන්නට පිං කළයුතුය. මව් සෙනෙහස පිරිනමන්නටත් පිං කළ යුතුය. මව් පදවිය ලැබූ පමණින් මවක් වීමට වරම්ද නොමැත.

**නලීන් කරුණාරත්න**


ලක්බිම කාගෝ
PLEASANT STAR
INTERNATIONAL SHIPPING L.L.C.
PS INT'L
WAREHOUSE 2, INDUSTRIAL AREA NO.2, RAS AL KHOR, P.O. BOX: 239786, DUBAI - U.A.E
E-mail: lakbimacargo@gmail.com
CARGO SERVICES
DUBAI TO
COLOMBO
Abu Dhabi - Tel: 055 499 0500
Dubai - Tel: 054 586 5223
Sharjah - Tel: 054 586 5221
Ajman - Tel: 054 586 5224
Office - Tel: 050 129 5425
: 04 399 3752
100% ශ්‍රී ලාංකිකයි
•දේශීයත්වය අගයන...
•දේශීය නම දැරූ...
•දේශීය ආයතනය...






# භාණ්ඩ ප්‍රවාහනයේ දැවැන්තයා සිලෝන් ෂිපිං ලයින්ස්









ශ්‍රී ලංකාව තුළ සේවාවන් රැසක් සිදුකරන විශාලම ව්‍යාපාරික සමාගමක් වන සිලෝන් ෂිපිං ලයින්ස් ආයතනයේ විවිධ වූ සේවාවන් අතරින් භාණ්ඩ ප්‍රවාහනයද ප්‍රධාන අංගයකි. කොළඹ, මරදාන, ඩී. ආර් විජේවර්ධන මාවතේ, අංක 50 හි හෙවත් මරදානේ ප්‍රසිද්ධ "ගාමිණී හෝල් හංදිය" ඉදිරිපිට ප්‍රධාන කාර්යාලය පිහිටා ඇත.

ලොව ඕනෑම රටක සිටින අයෙකුට හෝ ආයතනයකට ලංකාවේ සිටින ඔබ සතු යම් භාණ්ඩයක් නියමිත පරිදි නියමිත වේලාවට පූර්ණ ආරක්ෂාව යටතේ යැවීමට අවශ්‍ය නම් ඒ සඳහා සුදුසුම ආයතනය සිලෝන් ෂිපිං ලයින්ස් හි නාවික දෙපාර්තමේන්තුවයි.

ඕනෑම ප්‍රමාණයක භාණ්ඩ මෙම සේවාව හරහා විදෙස් රටවලට ප්‍රවාහනය කරගත හැක. මේ සඳහා ක්‍රම තුනක් අනුගමනය කරයි.

* **නැව් මගින් අදාල රටට යැවීම**
* **ගුවන් මගින් ආදාල රටට යැවීම**
* **ගුවන් මගින් යවා අදාල රටේ අදාල ආයතනයට හෝ පුද්ගලයාට හෝ බාර දීම**

මේ සඳහා සිලෝන් ෂිපිං ලයින්ස් නාවික අංශයේ විශේෂඥ දැනුම ඇති නිලධාරීන් සිටිති. ඔබේ අවශ්‍යතාව ඔබගේ භාණ්ඩ වල ස්වභාවය ඔවුන්ට ප්‍රකාශ කිරීමෙන් ඔවුන් භාණ්ඩ ප්‍රවාහනය සිදුකළ යුතු ආකාරය පිළිබඳ පැහැදිලි විස්තරයක් ලබා දෙනු ඇත. ඒ අනුව ඔබට කළ යුත්තේ කුමක් දැයි තීරණය කළ හැකි වනු ඇත.

ඊට අමතරව කන්ටේනර් බහාලුම් අපනයනය කිරීම්ද භාරග නු ලබයි. ලංකාවෙන් විදේශ රටක සිටින ඔබගේ ඥාතියෙකු හිතවතෙකුට එසේත් නැතිනම් යම් ආයතනයකට යැවීමට අවශ්‍ය ඕනෑම ප්‍රමාණයක භාණ්ඩ ප්‍රවාහනය සඳහා ඇනවුම් බාර ගනු ඇත.

මීට අමතරව වෙනත් රටක සිටින ඔබගේ ඥාති හිතවතෙකුට හෝ ආයතනයකට ඉතා ඉක්මනින් ලබා දීමට අවශ්‍ය ලිපි ලේඛන එසේත් නැතිනම් තෑගි භාණ්ඩ ආදී ඕනෑම ද්‍රව්‍යයක් කුරියර් සේවාවන් හරහා අදාල පුද්ගලයාට හෝ ආයතනයට ලබා දීමේ හැකියාවද සිලෝන් ෂිපිං ලයින්ස් නාවික අංශය සතුව ඇත.

එමගින් සිදුකරන තවත් සේවාවක් නම් ලංකාවේ වරායට හෝ ගුවන් තොටුපලට හෝ රේගුව බාරයට ආ භාණ්ඩ ඇතිනම් ඊට අවශ්‍ය නෛතික ක්‍රියා පිළිවෙල අනුගමනය කරමින් අදාල ආයතනයට හෝ පුද්ගලයාට නිදහස් කර අදාළ ස්ථානයට ප්‍රවාහනය කරදීමේ ඉහළම පහසුකම් වලින් සමන්විත ආයතනයකි.

ඊට අමතරව ආනයන අපනයන කටයුතු සඳහා අවශ්‍ය කරන සියලුම ප්‍රවාහන පහසුකම් වලින් කිසිඳු අඩුවක් නොමැති ආයතනයක් වන සිලෝන් ෂිපිං ලයින්ස් නාවික අංශය ඔබට අවශ්‍ය සියලුම විශේෂඥ දැනුම ද ලබා දෙනු ඇත.

සිලෝන් ෂිපිං ලයින්ස් නාවික අංශය විසින් මෙම සේවාවට අමතරව නාවික ඒජන්තවරුන් වශයෙන්ද කටයුතු කරන අතර නැව් සඳහා අවශ්‍ය සේවා පහසුකම් සැපයීමද සිදු කරයි.

**භාණ්ඩ ආනයනයේදීත් අපනයේදීත් ඇතුළු සියලු නාවික කටයුතු වලදී ඒවායේ ආරක්ෂාව හා විශ්වාසය පූර්ණ වශයෙන් රැකගන සිය සේවාවන් ඉටුකරනු ලබයි.**

ඒ අනුව නාවික ක්ෂේත්‍රයේ නියැලී සිටින ජාත්‍යන්තර නැව් සඳහා ද ලංකාවේ වරායවල් වල නැංගුරම් ලා ඇති නැව් සඳහා ද අවශ්‍ය කරන පානීය ජලය, ආහාරපාන, බෙහෙත් හේත් ඇතුළු එම නැව් වලට අවශ්‍ය සියලු පහසුකම් සපයා දීම සිදු කරයි. ඒ සඳහා නියෝජිත ආයතනයකි.

මෙම සියලු සේවාවන් එක් තැනකින් සිදු වන ආයතන ඇත්තේ ඉතා ස්වල්පයකි. එවැනි ආයතන අතරින් සිලෝන් ෂිපිං නාවික අංශය ඉදිරියෙන්ම සිටින ප්‍රමුඛ පෙළේ ආයතනයක් වෙයි.

භාණ්ඩ ආනයනයේදීත් අපනයේදීත් ඇතුළු සියලු නාවික කටයුතු වලදී ඒවායේ ආරක්ෂාව හා විශ්වාසය පූර්ණ වශයෙන් රැකගන සිය සේවාවන් ඉටුකරනු ලබයි.

ඔබ සතු භාණ්ඩ විදේශ රටක සිටින ඔබගේ ඥාති මිත්‍රයෙකුට හෝ එම රටක ආයතනයකට හෝ භාණ්ඩ වශයෙන් හෝ ලිපි ලේඛන වශයෙන් හෝ යැවීමට ඇත්නම් ඒ සඳහා විශ්වාසනීය ආයතනයක් වශයෙන් සිලෝන් ෂිපිං ලයින්ස් නාවික දෙපාර්තමේන්තුව හඳුන්වා දිය හැක. ඔබගේ සියලු භාණ්ඩ සඳහා රැකවරණයද සහතික වනු ඇත.

ඉතාම ලාභදායී තරගකාරී මිල ගනන් යටතේ අවම මිලකින් ඉක්මන් සේවවක් සපයා ගැනීමට ඔබට හැකි වනු ඇත.

**විදේශ රටකට යැවීමට ලොකු කුඩා යම් භාණ්ඩයක් හෝ ලිපි ද්‍රව්‍යයක් හෝ එසේත් නැතිනම් අපනයන භාණ්ඩ හෝ ඇත්නම් ඔබ දුරකථන අංක 0112689500 අංකයට කතාකරන්න. ඔබට අවශ්‍ය සියලුම තොරතුරු ලබාගත හැකිය. ඊට අමතරව 0777224624 අංකයට පූජිත ලියනගේ මහතා අමතන්න.**



SPECIAL OFFER

# ELLA TOUR







**LKR 8,500 PER PERSON PER NIGHT**

- Minimum 10 pax
- Conditions apply offer valid till end of August 2020

## Package Including:

- Hotel accomadation on full board basis
- Nine Arches Bridge Tour
- Little Adam's peak Hiking
- Ravana Falls
- Colobo to hotel return transfer on A/C vehicle

Please Contact us for further details,
Eranga - 0772672970
Lakmali - 077572835
Roshadi - 0773561210

Ceylon Shipping Lines Travels,
No. 450, D.R. Wijewardana Mawatha,
Colombo 10.
Tel: 011 - 2689500 - 8

CSL TRAVELS



# පාතාලය හා එක්වුණ නාකොටික් එකාපිට එකා කොටුවෙති.






ලංකාව පුරා මත්ද්‍රව්‍ය ජාවාරම දීර්ඝ කාලයක සිට සිදුවන්නකි. සමහර කාලවල මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් අතර සිදුවන මිනීමැරුම් ද ඉහළ යයි. තවත් කාලවල පොලීසිය දිගට හරහට මත්ද්‍රව්‍ය හා පාතාලය වටලයි. නැවතත් කාලයේ වැලි තලාවෙන් වැසී ගොස් පාතාලය ඉහළට එයි. ඒ කාලයට රට පුරා කතාව පාතාලය ගැනය. මත් කුඩු සඳහා ශ්‍රී ලංකාව අන්තර්ජාතික හුවමාරු මධ්‍යස්ථානයක් වශයෙන්ද ක්‍රියාත්මක වන බවට වාර්තා පලවෙයි. පසු ගිය කාල වල කුඩු තොග පිටින් හසුවන්නට විය. “අල්ලන කුඩු වලට මොකද වෙන්නේ” ආදී වශයෙන් ජනතාව අතර මහත් ආන්දෝලනයක් ඇති විය.

කොරෝනා වසංගතයක් සමඟ රට පුරා පැවැති “ලොක් ඩවුන්” එක ඉවරවේගන එනවාත් සමග තැනින් තැන කුඩු අසුවන්නත් පාතාල ක්‍රියාකාරකම් මිනීමැරුම් වැඩිවන්නත් පටන් ගත්තේය.

මේ පිළිබඳව රජයේ ඇඩි අවධානය යොමුවිය. බොහෝ මෙහෙයුම් බන්ධනාගාරය තුළ සිදුවන බවට තොරතුරු ලැබින. රටපුරා පොලිස් අංශ බුද්ධි අංශ සක්‍රීය කරමින් පාතාල මර්ධනයේ මූලාරම්භය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අතින් ආරම්භ කළහ. දිගින් දිගට කුඩු හා පාතාල ක්‍රියා කාරකයින් මෙන්ම අවි ගබඩා ද හසුවන්නට විය.

මේ අතර මිනුවන්ගෙ ාඩ පොලීසියට ඔත්තුවක් ලැබිණ. එම ඔත්තුවත් සමඟ කුඩු ජාවාරමේ නොදුටු හා භයංකාරව තොරතුරු හෙළිවන්නට පටන් ගත්තේ ඒ ඔස්සේය.

තොරතුරෙන් කියවුනේ යටියන ග්‍රාමයේ අයෙකු කුඩු ජාවාරම සිදු කරන බවයි. මෙම පුද්ගලයා පන්සල හා ලැදි ගමටත් ජනයාටත් බොහෝ උදව්පදව් ඇති කිසිඳු දිනක මත්ද්‍රව්‍ය පිළිබඳ චෝදනා එල්ල නොවූ අයෙකු වූ බැවින් පොලීසියද තරමක් තිගැස්සී සිටියේය.

පොලීසිය ගමේ පන්සලේ රැස්වීමක්ද කැඳවිය. ජනතාව පොලීසියට චෝදනා කළහ. “ටයිල් චමින්ද කුඩු විකුණනවා පොලීසිය අල්ලන්නෑ” ගම්මු එසේ කීහ. ස්ථානාධිපතිවරයා ජනතාවගෙන් සති දෙකක කාලයක් ඉල්ලුවේය.

ඉහළ නිලධාරීන් ද දැනුවත් කළ පොලිස් ස්ථානාධිපතිවරයා විසින්ම පොලීසියේ නිලධාරීන් යොදවා දිනක මෙහෙයුමක් සිදුකළේය. කුඩු ග්‍රෑම් පහක් සමඟ චමින්ද කොටුකර ගත්තේය. ඔහුගේ දුරකථනය ද පොලීසිය අතට පත්විය. ඔහුගේ දුරකථනය පරීක්ෂා කිරීමේදී දුරකථන ඇමතුම් වලට අමතරව අසාමාන්‍ය ලෙස ඊසි කැෂ් එන බව පෙනුනි. 7500, 25000, 30000 ආදී වශයෙන් නිතර නිතර මුදල් වැටී ඇති බව පෙනුනි. ඒවා විවිධ පළාත් වලින් ද පැමිණ ඇත. කුඩු ග්‍රෑම් එකක මිල රු. 7500 හෝ 8000 ය.

චමින්දව දිගින් දිගටම ප්‍රශ්න කිරීම්වලට ලක්විය. ඔහු විවිධ පිළිතුරු ලබා දුන්නත් පොලීසිය සෑහීමකට පත් නොවීය. අනතුරුව චමින්දගෙ බැංකු ගිණුම් පරීක්ෂා කළේය. ජූනි මාසේ මිලියන 52 ක් මැයි මිලියන 17, අප්‍රේල් 16, මාර්තු 24 යි, නොවැම්බර් 2, දෙසැම්බර් 33 යි, ජනවාරි 39 ආදී විදියට ලංකාව පුරාම බැංකුවලින් ඔහුගේ ගිණුමට මිලියන ගනනින් මුදල් වැටී ඇත. මෙය අසාමාන්‍ය මුදල් ලැබීමක් වැඬේ බරපතලකම එයින්ම වැටහෙයි.

වහාම පොලිස් ස්ථානාධිපතිවරයා කළේ උසස් නිලධාරීන් දැනුවත් කිරීමය. අනතුරුව මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය (නාකොටික්) වෙත දැන්වීය. ඒ අනුව නාකොටික් හි නිලධාරීන් කණ්ඩායමක් පැමිණ චමින්ද ගෙන් ප්‍රශ්න කළහ.

ප්‍රශ්න කිරීමෙන් අනතුරුව නාකොටික් නිලධාරීන් පැවසුවේ සැකකරුට ඩුබායිවලින් කුඩු ලැබෙන බවත් සැකකරු ඔවුන්ගේ කළමනාකරුවෙකු බවත්ය. ස්ථානාධිපති ඒ කතාව එලෙසින්ම පිළිගත්තේ නැත. ස්ථානාධිපතිවරයා නොයෙක් අතට කල්පනා කරමින් තවත් නාකොටික් නිලධාරීන් කණ්ඩායමක් ගෙන්වා ගත්තේය. මේ අතර 2020.04.29 ත් 2020.05.02 අතර කාලයේ නිල්පාට කැබ් රථයකින් මිනුවන්ගොඩ ප්‍රදේශයට කුඩු කිලෝ 90 ක් ගෙන ආ ආරංචිය පොලීසියට ලැබිණ.

එම කුඩු චමින්ද බාර ගත් බව අවසානයේ පිළිගත් අතර එහෙත් සොයා ගත නොහැකි විය. එයින් කොටසක් ඥාතියෙකු ගේ නිවසක තැබූ බවත් දැන ගන්නට ලැබුණි. එම නිවසට ගිය පොලීසියට නිවෙස් හිමියන් කීවේ දින දෙකකට පෙර ඒවා පිරිසක් රැගෙන ගිය බවයි. මේ අතර තවත් ප්‍රදේශයක කුඩු කිලෝ 15 ක් ඇති බවට තොරතුරක් ලැබිණ. ඒ තොරතුර ඔස්සේ ගොස් පරීක්ෂා කිරීමේදී එතන තිබූ කුඩු කිලෝ 11 ක් පිටකර හමාරය. ඒ සැකකරුවන් ගෙන් ප්‍රශ්න කිරීමේදී ඔවුන් කියා සිටියේ දින දෙකකට පෙර කළු පාට වෑන් එකකින් ආ දෙදෙනෙකුට දුන් බවයි. චමින්ද ගේ ඥාතීන් ගෙන් ප්‍රශ්න කිරීමේදී ඔවුන්ද කීවේ ඔවුන් ලග තිබූ කුඩු ගෙන ගියේ කළුපාට වෑන් රියකින් ආ දෙදෙනෙකු බවයි.

පොලිස් ස්ථානාධිපතිට මෙම “දෙදෙනා” කවුද යන්න සැකයක් පහළ විය හැඩහුරුකම් ආ ගිය හැටි සියල්ලම විමසා බැලීය ඔහුට සැක සිතුනේ නාකොටික් එකෙන් දින දෙකකට පෙර පැමිණි චමින්ද ප්‍රශ්න කළ විමර්ශන නිලධාරීන් ගැනය. ඔවුන් ගේ ජායා රූප පෙන්වා දෙගොල්ලන්ගෙන්ම විමසූ විට ඔවුන් එම දෙදෙනා හඳුනා ගත්හ.

19 වෙනි පිටුවට...

18 වැනි පිටුවෙන්...

# පාතාලය හා එක්වුණ නාකොටික් එකාපිට එකා කොටුවෙති.....

ස්ථානාධිපතිවරයාව විශ්මයට පත්කළ කාරණයක් විය. ඔහු වහාම ඉහළ නිලධාරීන් දැනුවත් කළේය. ඒ අනුව එම නිලධාරීන් අත් අඩංගුවට ගැනුනි. ඔවුන් එදා විමර්ශනයට පැමිණ ඉතිරි වී තිබූ කුඩු රැගෙන ගොස් ඇත. ඔවුන් ආගිය හැටි තොරතුරු CCTV ඔස්සේ විමර්ශනය කළ පසු සියල්ල තහවුරු විය.

ඔවුන් ප්‍රශ්න කිරීමේදී වල දමා තිබූ තුන්කෝටියකට අධික මුදල් ද හමුවිය. ඒ ඔස්සේ දිගින් දිගට පරීක්ෂා කළ අතර වාහන මුදල් යතුරුපැදි මීට අදාල නොයෙක් දේ සොයා ගැනීමට පොලීසියට හැකි විය. නාකොටික් අංශයේ මේ වනවිට 12 අධික පිරිසක් අත් අඩංගුවට ගෙන ඇති අතර එහි සිටි I P ද පසුව පොලීසියට බාර විය.



විවිධ වැටලීම්වලින් පසු හසුවන මත්ද්‍රව්‍ය රහස් පොලීසිය භාරයේ නඩු අවසන් වනතුරු ගබඩාවල සුරක්ෂිතව තැන්පත් කර තැබීම ක්‍රමවේදයයි. මෙම නාකොටික් නිලධාරීන් එම මත්ද්‍රව්‍ය බැග්වලට වෙනත් රසායනික ද්‍රව්‍ය ඇතුල් කොට එම බරට මත්ද්‍රව්‍ය සොරකම් කර ජාවාරම්කරුවන්ට අලෙවි කිරීමද සිදුකර ඇත.

පසුගිය මැයි 15 වනදා වැලිසර මහභාගයේදී අල්ලා ගන්නා ලද හොරොයින් කිලෝග්‍රෑම් 225 ක් මොවුන් ගාල්ල ප්‍රදේශයේ අවන්හලකට ගෙන ගොස් ඒවා සහල් මලුවල බහා නැවත කොළඹට ගෙනවිත් පාතාලයට බාරදී ඇත. ඒ සඳහා නායකත්වය ලබා දී ඇත්තේ මත්ද්‍රව්‍ය නාශක අංශයේ පොලිස් පරීක්ෂකවරයා විසිනි.

මේ සිදුවීම් දෙස බැලීමේදී මෙතෙක් කල් පාතාලය හා කුඩු ජාවාරම් සිදුවී ඇත්තේ පොලිස් මත්ද්‍රව්‍ය නාශක ඒකකය හා ඒකාබද්ධවය "වැටත් නියරත් ගොයම් කානම් කාට කියම්ද ඒ අමාරුව" යන ප්‍රස්ථාපිරුළු සිහි ගන්වයි. හොරුන් සමග හොරු අල්ලන්න ඉන්න උන් ඒකාබද්ධව සොරකම සිදුවී ඇත. මෙතෙක් කුඩු හා පාතාලය මර්ධනය කිරීමට නොහැකි වූයේ මේ හේතුව නිසා බව පැහැදිලිය. මේ තුළ නොතිබුණු තවත් තොරතුරු බොහෝ තිබෙන්නට පුළුවන. සියලු තොරතුරු සොයා ගත් පසු පාතාලය හා කුඩු වසංගතය මෙරටින් තුරන් කළ හැකි වනු ඇත. ඒ සඳහා අවශ්‍ය වන්නේ වගකිව යුත්තන් ගේ කැපවීම පමණි.

විවිධ වැටලීම්වලින් පසු හසුවන මත්ද්‍රව්‍ය රහස් පොලීසිය භාරයේ නඩු අවසන් වනතුරු ගබඩාවල සුරක්ෂිතව තැන්පත් කර තැබීම ක්‍රමවේදයයි. මෙම නාකොටික් නිලධාරීන් එම මත්ද්‍රව්‍ය බෑග්වලට වෙනත් රසායනික ද්‍රව්‍ය ඇතුල් කොට එම බරට මත්ද්‍රව්‍ය සොරකම් කර ජාවාරම්කරුවන්ට අලෙවි කිරීමද සිදුකර ඇත.



# 'අනගි' කාන්තා ගිණුම් හිමියන්ට රුපියල් 500,000 ක් දක්වා අනතුරු රක්ෂණාවරණයක් නොමිලේ




කොමර්ෂල් බැංකුවේ 'අනගි' කාන්තා ඉතිරිකිරීමේ ගිණුම් හිමි කාන්තාවන්ට තමන්ගේ ගිණුමේ නිර්දේශිත අවම ඉතිරි කිරීමක් පවත්වාගෙන යන්නේ නම් රුපියල් 500,000 ක් දක්වා නොමිලේ පුද්ගලික අනතුරු රක්ෂණාවරණයක් ලබාග ැනීමේ අවස්ථාව බැංකුව විසින් ලබාදී තිබේ.

මෙම පුද්ගලික අනතුරු රක්ෂණාවරණය ෆෙයාෆර්ස්ට් රක්ෂණ සමාගම හරහා ලබාදෙන අතර මෙම රක්ෂණ සමාගම ලෝකයේ විශාලතම සාමාන්‍ය රක්ෂණ සමූහයක් වන ෆෙයාෆැක්ස් සමාගමට අනුබද්ධ සමාගමකි. බැංකුව සඳහන් කරන්නේ මාස හයක කාලයක් තුළ 'අනගි' ගිණුමක් තුළ රුපියල් 250,000 ක ශේෂයක් පවත්වාගෙන යන කාන්තාවන්ට මෙම පුද්ගලික අනතුරු රක්ෂණාවරණය පිරිනමන බවයි.

කාන්තාවන්ගේ කාර්ය බහුල ජීවන රටාවට වැඩිපුර අගය එකතු කිරීමක් කිරීම සඳහා මෙම පුද්ගලික අනතුරු රක්ෂණාවරණය ලබාදුන් බව බැංකුව වැඩිදුරටත් සඳහන් කරයි. අවුරුදු 18 සිට අවුරුදු 70 ක් දක්වා 'අනගි' ගිණුම් හිමි කාන්තාවන් මෙම රක්ෂණාවරණය ලබාගැ නීමට සුදුසුකම් ලබයි.

හදිසි මියයෑම්, සදාකාලික පූර්ණ ආබාධිත වීමක් සහ සදාකාලික අර්ධ ආබාධිත වීමක් මෙම රක්ෂණාවරණයට ඇතුළත් වන බව කොමර්ෂල් බැංකුව සඳහන් කරයි. මෙම පහසුකම සඳහා සුදුසුකම් ලබන 'අනගි' ගිණුම් හිමියන්ට අනතුරක් වීමෙන් පසුව බැංකුවේ ළඟම ශාඛාවට තම රක්ෂණාවරණය ඉදිරිපත් කිරීමෙන් පසුව එහි ප්‍රතිලාභ ලබාගත හැකිවේ. යම් අවස්ථාවක 'අනගි' ගිණුම් හිමි කාන්තාව අවාසනාවන්ත ලෙස මරණයට පත්වුවහොත් ඇය විසින් නම් කරන ප්‍රතිලාභීන්ට බැංකුව විසින් රුපියල් 500,000 ක මුදල ලබාදෙනු ඇත.

රක්ෂණය, ප්‍රතිරක්ෂණය සහ ආයෝජන කළමනාකරණය පිළිබඳව විශේෂඥතාවයක් දරන ෆෙයාෆර්ස්ට් රක්ෂණ සමාග මට ශ්‍රී ලංකාව පුරා විහිදුණු ශාඛා 57 ක් තිබෙන අතර 1400 ක වෘත්තීය කණ්ඩායමක් සේවයේ යෙදී සිටී.

කාන්තා ඉතිරිකිරීමේ ගිණුම් සඳහා ඉහළම පොලී අනුපාතයක් ලබාදීම සහ මුදල් ආපසු ගැනීමේදී කිසිඳු සීමාකිරීමක් නොකිරීම යන සහන ලබාදෙමින් මෙරට කාන්තාවගේ මූල්‍ය ස්ථාවරත්වය ගොඩ නැගීම වෙනුවෙන් කොමර්ෂල් බැංකුව විසින් 2012 වසරේදී 'අනගි' කාන්තා ඉතිරි කිරීමේ ගිණුම හඳුන්වා දෙන ලදී. මෙම ගිණුම් හිමියන්ට බැංකුව විසින් සන්නාමකරණය කළ බැංකු පාස්පොතක් සහ වසර පුරාම ආකර්ශනීය ප්‍රවර්ධනයන් පිරිනමන 'අනගි' ෂොපිං ඩෙබිට් කාඩ්පතක් ලබාදෙයි.

ලෝකයේ හොඳම බැංකු 1000 අතරට නම් වූ ප්‍රථම දේශීය බැංකුව සහ පිට පිටම දස වතාවක් එසේ නම් වූ එකම ශ්‍රී ලාංකේය බැංකුව වන කොමර්ෂල් බැංකුව 2020 වසරේදී සියවස සමරයි. කොමර්ෂල් බැංකුව මෙරට බැංකු ශාඛා 268 ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 865 ක් පවත්වාගෙන යයි. බැංකුව 2019 වසරේදී ජාත්‍යන්තර සහ දේශීය සම්මාන 50 කට වැඩි ප්‍රමාණයක් දිනා ගැනීමට සමත්ව තිබේ.

බංග්ලාදේශය තුළ ශාඛා 19 ක් ද මියන්මාරයේ යැන්ගෙ ාන්හි, නියෝජිත කාර්යාලයක් සහ නේ පයිටව් හි, ක්ෂුද්‍ර මූල්‍යන සමාගමක් මෙන්ම මාලදිවයින තුළ බහුතර කොටස් හිමිකාරීත්වයෙන් යුතු පළමු පෙළ බැංකුවකින් සමන්විත විදේශීය මෙහෙයුමක් පවත්වාගෙන යන ශ්‍රී ලංකාවේ එකම පුද්ගලික වාණිජ බැංකුව කොමර්ෂල් බැංකුව වේ.

# ධීවර ජනතාව නංවන්නට මහජන බැංකුවේ අස්වැන්න ණය කල්පිටියේදී පිරිනැමේ.

රජයේ සංවර්ධන වැඩපිළිවෙලට සමගාමීව යළි ස්වයංපෝෂිත රටක් බිහිකිරීමේ සරු බලාපොරොත්තුව වෙනුවෙන් මහජන බැංකුව හඳුන්වා දී ඇති අස්වැන්න ණය පහසුකම් පිරිනැමීම පසුගියදා කල්පිටියල කන්දකුලිය, කුඩාව වෙරළ තීරයේදී මහජන බැංකුවේ සභාපති සුජීව රාජපක්ෂ හා ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී රංජිත් කොඩිතුවක්කු යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි.

මේ යටතේ විශේෂයෙන් ධීවර කර්මාන්තය සඳහා බහුදින යාත්‍රා සහ එක්දින යාත්‍රා මිලදී ගැනීමට, දැල් ආම්පන්න ඇතුළු වෙනත් ආම්පන්න මිලදී ගැනීමට මෙන්ම අයිස් නිෂ්පාදන කර්මාන්තයට අදාළ ණය මුදල් පිරිනැමිණි. මීට අමතරව කාන්තා ව්‍යවසායිකාවන් බලගැන්වීමේ අරමුණින් මහජන බැංකුව හඳුන්වා දී ඇති වනිතා සවිය ණය පහසුකම්ද මෙදින ගනුදෙනුකාරිනියන් වෙත පිරිනැමිණි.

මෙම අවස්ථාවට මහජන බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනි (ව්‍යවසායකත්ව බැංකු කටයුතු) ක්‍රිෂානි නාරංගොඩ, සහකාර සාමාන්‍යාධිකාරී (සුළු හා මධ්‍ය පරිමාණ) වික්‍රම නාරායන, සහකාර සාමාන්‍යාධිකාරිනි (සංවර්ධන මූල්‍ය) යූ.එස් ගර්ට්, සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ) ඒ.යූ.ඒ. අන්සාර්, පුත්තලම ප්‍රාදේශිය කළමනාකාර ලාල් පීරිස් යන මහත්ම මහත්මීන් ඇතුළු පිරිසක් සහභාගි විය.




මහජන බැංකුවේ සභාපති සුජීව රාජපක්ෂ හා ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී රංජිත් කොඩිතුවක්කු යන මහත්වරුන් ණය පහසුකමක් පිරිනමන අයුරු

සීමිත සිලෝන් ෂිපිං ලයින්ස් සමාගම
சிலோன் ஷிப்பிங் லைன்ஸ் லிமிட்டட்
Ceylon Shipping Lines Ltd.

අංක 450, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව.
දුරකථන : +94 11 2689500-508
ෆැක්ස් : +94 11 2689510/2674347
ඊ මේල් : csl123@sltnet.lk
අන්තර්ජාලය : www. ceylonshippinlines.com

இல: 450, டீ. ஆர். விஜேவர்தன மாவத்தை,
கொழும்பு 10, இலங்கை.
தொலைலபேசி : 0094 11 2689500-508
தொலைநகல் : 0094 11 2689510, 2674347
மின்னஞ்சல் : csl123@sltnet.lk
இணையம் : www.ceylonshippinglines.com

450, D.R. Wijewardena Mawatha,
Colombo 10, Sri Lanka.
Tel : 2689500-508 Fax : 2689510/2674347
E-mail : csl123@sltnet.lk
Web: www.ceylonshippinglines.com

ප්‍රධාන නිෂ්කාශන මධ්‍යස්ථානය
කොළඹ / கொழும்பு / Colombo

අංක. 760, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 09, ශ්‍රී ලංකාව.
දුරකථනය : +94 11 268-0301-5
ෆැක්ස් : +94 11 2680309/10
ඊ-මේල් : cslupb@sltnet.lk

இல. 760, டொக்டர் டெனிஸ்டர் தி சில்வா மாவத்த,
கொழும்பு 09, ஸ்ரீ லங்கா.
தெலைபேசி : +94 11 268-0301-5
தொலைநகல் : +94 11 2680309/10
மின்னஞ்சல் : cslupb@sltnet.lk

760, Dr. Danister De Silva Mawatha,
Colombo 09, Sri Lanka.
Tel: +94 11 2680301-5 Fax: +94 11 2680309/10
Email: cslupb@sltnet.lk

නිෂ්කාශන මධ්‍යස්ථානය
මහනුවර / கண்டி / Kandy

අංක 175, පරණ ගංතොට පාර,
මාවිල්මඩ, මහනුවර.
දුරකථන : +94 81 2234356-57, +94 81 4471935
ෆැක්ස් : +94 81 2234360

இல. 175, பழைய கங்தொட வீதி,
மாவில்மட, கண்டி.
தெலைபேசி : 0094 812234356-57,0094 814471935
தொலைநகல் : 0094 812234360

175, Paranagantota Road,
Mawilmada, Kandy.
Tel : +94 81 2234356-57, +94 81 4471935
Fax : +94 81 2234360

නිෂ්කාශන මධ්‍යස්ථානය
මඩකලපුව /மட்டகழப்பு / Batticaloa

අංක: 134, මහා වීදිය, අඩලච්චේනෙයි 09.
දුරකථන/ෆැක්ස් : +94 67 2277302
ජංගම : +94 774503759

இல. 134 பிரதான வீதி, அட்டாளைச்சேனை 09.
தெலைசே-பெக்ஸ் : 0094(0)67 2277302
கைத்தொலைபேசி : 0094 774503759

No. 134, Main Street, Addlaichchenai 09.
Tel/Fax : +94 67 2277302
Mobile : +94 774503759

**Need assistance to extend your visa in Sri Lanka**



**Call us for further details,**

Roshadi : 077 356 1210

Keerthi : 077 739 7055

Ceylon Shipping Lines Travels,
No. 450, D.R. Wijewardana Mw.,
Colombo 10.
Tel : 011 - 2689500 - 8
Email : csltravels@sltnet.lk

CSL TRAVELS

ස යු රේ න්
එතෙර

# රට ලොක්ඩවුන් කළද ජනතාව ලොක්ඩවුන් නොවන්නේ ඇයි.




කොරෝනා වෛරසයට තාමත් ඖෂධයක් සොයාගෙන නොමැත. බෙහෙතක් නැති රෝග යකි. මරණයෙන් කෙළවර වීමට ඇති ඉඩකඩ ඉතා වැඩිය. විශේෂයෙන් වෛරස් රෝග සඳහා බෙහෙත් නැත. වෛරස් රෝග සුව වන්නේ ශරීරයේ ඇති ප්‍රතිශක්තියෙනි. ශරීරයට ඇතුළුවන විෂ බීජ ආසාදනය නොවී විනාශ කිරීමට ප්‍රතිදේහ ප්‍රයෝජනවත් වෙයි. ශරීර ශක්තිය වැඩි හා නිරෝගී අයට ප්‍රතිශක්තිය වැඩිය.

නමුත් මේ අයට රෝග වාහකයන් විය හැක. ශරීරයේ වසන වෛරස් ප්‍රතිශක්තිය අඩු තවත් අයෙකු ගේ ශරීරයේ ගැවීම කරණකොට ගෙන එම දුර්වලයාට රෝගය ඇති වීමේ ඉඩකඩ වැඩිය.

විශේෂයෙන් කෝවිඩ් 19 වෛරසය මෙතෙක් පැවති වෛරස් රෝග වලට වඩා වේගයෙන් ව්‍යාප්තවීම හේතුවෙන් දිනකට සිය ගනනක් ආසාදිතයින් බිහි කරයි.

මේ නිසා මෙයින් බේරීමට හැකි එකම මාර්ගය දුරස්තභාවයයි. පුද්ගලයෙකුගෙන් පුද්ගලයෙකුට ඇති දුර අඩු තරමින් මීටරයක් රඳවා ගැනීම මගින් මේ රෝග යෙන් බේරීමට හැකිවෙයි. නමුත් දෛනිකව අපි පුරුදු පුහුණු වී සිටින හා දෛනික ක්‍රියාකාරකම් වල නිරත වීමේදී මෙම දුරස්ථ භාවය රැග ගත නොහැක.

එය ආරක්ෂා කර ගැනීම සඳහා රජය මගින් නිරෝධායන ඇඳිරි නීතිය, ලොක් ඩවුන් වැනි ක්‍රියාමාර්ග වලට යයි. ලොව හැම රටක්ම මේවා එකක් හෝ කීපයක් මේ වන විට සිදු කර ඇත.

ඇඳිරිනීතිය හෝ රට වැසීම (ලොක් ඩවුන්) සිදු කළ විට ජනතාව සිය නිවෙස් වල හුදකලාව සිටිය යුතුය. සියලු ජනයා සියයට සියයක්ම හුදකලා වී දින 23 ක් හෝ 30 ක් සිටිය හොත් මෙම රෝගය එම රටින් හෝ ප්‍රදේශයෙන් සහමුලින්ම නැති වී යයි.

එහෙත් ජනතාව එසේ කරන්නේ නැත. ලංකාව තුළ ඇඳිරිනීතිය මාස කීපයක් පැවැතියි. එම කාලය තුළ එකම දිනක් හෝ නිවසේ රැඳී නොසිටිය පිරිස් සිටිති ඒ ඇයි.

සමහර පිරිස් එසේ නොසිටින්නේ රෝගය හෝ රජයේ නිවේදනය පිළිබඳව හෝ වගකීමක් නොමැති කමිනි.

තවත් පිරිසක් රජයේ නිවේදනයට ගරු කිරීමට අකමැත්ත නිසා නීතිය කඩා දමයි.

තවත් පිරිසක් ඇඳිරි නීති සමයේ පාර තොටේ ඇවිද ගොස් නීතියට අභියෝග කිරීම තුළින් මානසික වීරත්වයක් ලබමින් සතුටු වෙති.

තවත් පිරිසක් ඇඳිරි නීතිය මුවාවෙන් යම් යම් දේ වැඩි මිලට විකිණීම මගින් යම් ධනයක් ඉපයීමේ කැදරකමින් පෙළෙන්නෝ වෙති.

නීති විරෝධී ක්‍රියාවන්ට ඇබ්බැහි වූ පිරිස් නිහඬ වට පිටාව සිය නීති විරෝධී කටයුතු සඳහා සුදුසු භූමියක් බවට පත් කර ගනිති.

තවත් පිරිස් බිය නිසා මෙම නිරෝධායන නීති උල්ලංඝණය කරති. කෑම බීම බෙත් හේත් ආදිය හිඟවේ යැයි සිතා ඒවා කල් වේලාසන අනිත් අය ලබාගැනීමට ප්‍රථම ලබා ගැනීමට උත්සහ දරති.

මේ අතර තවත් අය විවිධ සබඳතා හේතුවෙන් යහළු මිත්‍ර ඥාති පිරිස් දැක බලා ගැනීම සඳහා පිටව යති.

ජන ඝණත්වය වැඩි ප්‍රදේශ තට්ටු නිවාස මුඩුක්කු ප්‍රධාන නගර ආශ්‍රිත අඩු භූමි තුළ වැඩි ගහනයක් සිටින ප්‍රදේශ ආදියෙහි නිවසට කොටුවී සිටීමට නොහැකි කම

23 පිටුවට...





22 පිටුවෙන්...

# රට ලොක්ඩවුන් කළද ජනතාව ලොක්ඩවුන් නොවන්නේ ඇයි....

වටපිටාව නොපෙනීම ආදිය හේතුවෙන් සිතේ ඇතිවන ආතතිය විපිලිසර බව පීඩනය හේතුවෙන් නිවසෙන් එළියට බසිති.

සිය නිවෙස් තුළ සිටින එකිනෙකා නොරුස්සන ස්වභාවය අසමගිය අප්‍රිය බව ආදිය හේතුවෙන් ඇතිවන මානසික පීඩාව දරාගත නොහැකිවීම හේතු කරගෙන නිවසින් බැහැරට යති.

කාලයත් සමඟ ඇති වන අගහිඟතා හේතුවෙන් හේතුවක් නොමැතිව වුවද බැහැරට යෑමට සිත දෙයි.

මේ සියලු කරුණු විශම සමාජයක් තුළ පවතින පොදු ලක්ෂණයන්ය. මේ සියලු ප්‍රශ්න විසඳා ජනයා නිවසට වී සිටීමේ පුහුණුවක් ලබා දී නිවෙස් තුළ කොටු කිරීමට රජයකට හෝ කිසිඳු ජගතෙකුට නොහැක.

ආසාදිතයින් මිලියන 05 පසුකර මරණ ලක්ෂය පසුකරන අවදියේත් ඇමරිකානු ජනයා පාරට බැස නීති ලිහිල් කර එළියට යන්නට ඉඩදෙන ලෙස ඉල්ලා උද්ඝෝෂණය කළහ. මරණ බිය ඉක්මවා සිරවී සිටීමේ පීඩාව පුපුරායෑම ඒතුළින් දැකිය හැක. මීට සාපේක්ෂව සිර දඬුවමක් විඳින්නට සිදුවූ විට මිනිසා තුළ ඇතිවන පීඩනය සිතාගත හැක.



මෙම පීඩනය උපේක්ෂාවෙන් දරාගත හැකි පිරිස් සිටින්නේ ඉතා අතලොස්සකි. මේ සියල්ලෙන් කුමක් හෝ කර නීතිය කඩන්නේ මානසික ඒකාග්‍රතාවය නොමැති පිරිස් ය. මොවුන් උපේක්ෂා ගුණය පුහුණුකර නැත. මෙය වදයක් නොවන ලෙස දරාගැනීමට නම් අධ්‍යාත්මික ගුණයක් තමා සතුව තිබිය යුතුය. එසේ නොවන සැමට ම එය වදයකි.

තට්ටු නිවසේ හෝ කුඩා නිවසක හෝ මුඩුක්කුවක පැල්පතක හෝ ඕනෑම තැනක අධ්‍යාත්මික ගුණයෙන් මුහුකුරා ගිය අයෙකුට දරාගෙන සිටිය හැක. බඩගින්න වෙනුවෙන් ආහාර සොයා යෑම සිදුවෙයි. එය වැළැක්විය නොහැක. එහෙත් එවැනි අද්‍යාත්මික ගුණයක් ඇත්තන් සමාජ දුරස්ථභාවය රැකගැනීම සිදුකරයි. එය සංවරව හා විනීතව විනය ගරුකව සිදුකරනු ඇත.

මෙම නිරෝධායන සමයේ තම තමන් හුදකලා වූ අයුරු නැවත නැවත සිහි කරන්නේ නම් ඇතිවූ මානසික පීඩනයන් සිහිකරන්නේ නම් ඒවාට හේතුව සොයා බලන්නේ නම් හෝ නීති කැඩූ අවස්ථා මෙනෙහි කරන්නේ නම් තම තමන් ගේ හෘදය සාක්ෂියට ඇත්ත යුක්තිය වැටහෙනු ඇත.

අඩුම තරමින් තමා සිරවී සිටින සීමාව තුළ පවතින වටපිටාව පරිසරය සම්පත් සැලකිල්ලට ගෙන යම් ක්‍රියාකාරකමකට යොමු වීමට තරම්වත් මොවුන්ගේ ප්‍රඥාගුණය වර්ධනය වී නොමැත.

පමස්ත ලෝක ජනයාගේම සිය මානසික ක්‍රියාකාරකම්වල පොදු දුර්වලතා හඳුනා ගැනීමට මෙය මහගු අවස්ථාවක් බවට පත්වී ඇත. එම දුර්වලතාව විසින් පෙන්නුම් කරන පොදු ලක්ෂණය නම් කොවිඩ් 19 වෛරසයට ඖෂධයක් සොයා නොගත්තොත් එම වෛරසය මෙලොවින් බැහැර නොයන බවයි.


# Ceylon Shipping Lines Ltd.
## Printing Department



CSL Printing is a fully fledged design printing department equipped with latest technology including Computer offset printing from concept to finished product, with the capacity and capability to undertake all types of commercial printing for local & overseas customers.

**Ceylon Shipping Lines Ltd.,**
**Printing Department,**
**No. 758/3, Dr. Danister De Silva Mawatha,**
**Colombo 09.**
**Tel: 011 - 2683237 Fax: 011 - 2683238**
**E- mail: cslpri@sltnet.lk**

**Head Office:**
**Ceylon Shipping Lines Ltd.,**
**No. 450, D.R. Wijewardana Mawatha,**
**Colombo 10.**
**Tel: 011 - 2689500 - 8**

# කොරෝනා ජයගත් චීන්නු



**කොරෝනා ආරම්භයත් සමඟ චීනයේ ඇතිවූ කලබලකාරී ස්වභාවය අපි රූපවාහිනි මාධ්‍ය මගින් දුටුවෙමු. එය තනිකර යුධ මෙහෙයුමකට සමාන විය. එම මෙහෙයුම දුටු ලෝකවාසීන් රෝගයේ බරපතලකම ඒ තුළින්ම අවබෝධ කරගත්හ.**

තම රට තුළින් මතුවූ මෙම විෂබීජය පිළිබඳව හෝ එහි මර්ධනය පිළිබඳව පූර්ණ අවබෝධයක් නැතුව වුවත් වේගයෙන් පාලනය කරමින් එයට මුහුණ දීපු චීනය ඔවුන් සතු ශක්තිය ලොවට ප්‍රදර්ශනය කර හමාරය.

චීන රාජ්‍යයේ පරිපාලන ව්‍යුහය ඉහළ සිට පහළට ගලාගන එන ආකාරයට මනාව පෙළගස්වා ඇත. ඉහළින්ම සිටින්නේ මධ්‍යම ආණ්ඩුවයි. අංක දෙක පළාත්ය. අංක තුන පලාත් නගරයි. මේ අංක තුන එක් කාණ්ඩයකි.

දෙවන කාණ්ඩයේ අංක එක වශයෙන් ගැනෙන්නේ ස්වායත්ත හා විශේෂ පරිපාලන ප්‍රදේශය. එහි අංක 2 කෝරළ හා ඒවාට අයත් නගරයි.

තුන්වන කාණ්ඩය නගරයි. මේ සියල්ල පළමු කාණ්ඩය හා බැඳී ඇති අතර පළමු කාණ්ඩයේ පළාත් හා පළාත් නගර පරිපාලන ඒකක මධ්‍යම ආණ්ඩුව හා කේන්ද්‍රගතය.

මේ ක්‍රමය නිසා මධ්‍යම ආණ්ඩුවේ සියලු නියෝග දැක්වීම් පහළම ඒකකය දක්වා ක්ෂණිකව ක්‍රියාත්මක වෙයි.

වරින් වර කොරෝනා පිළිබඳ සැක සංකා පහළ වුවත් එහි බරපතලකම ඔවුන් හඳුනාගත්තේ ජනවාරි මාසයේය. ජනවාරි 24 ඔවුන්ගේ නව අවුරුදු උදාව ආරම්භ වන දිනයයි. ඒ වන විට වුහාන් නගරයේ රෝගය පැතිරයෑම වේගවත් විය. 24 වන දිනය පසු කළොත් තත්ත්වය බරපතලය. හේතුව අවුරුදු නිමිත්තෙන් විශාල ජනතාවක් මහමග ඔබ මොබ යනු ඇත. ඒ නිසා 23 වන දින හුබෙයි පළාතට අයත් වුහන් නගරය වසා දැමුවේය. අනතුරුව හුබෙයි පළාතම වසා දැමුවේය. මීට අමතරව යම් ගමක රෝගියෙක් හමුවුවහොත් එම ගම්මානයම වසා දැමුවේය. මහල් නිවසක රෝගියෙක් හමුවුවහොත් එම මහල් නිවසම වසා දැමුවේය.

යොමු කළහ. වහපු තැනට කිසිවෙකු ඇතුළුවීමට හෝ පිටවීමට අවසරයක් නෑ. ඒ ඒ නිවෙස් හිමියන් ඔන්ලයින් (මංගත) ක්‍රමයට අවශ්‍ය දේවල් ඉල්ලූ විට ඒ ආසන්න මුරපොළට දුරකථන ඇමතුමක් ලබා දී තබා යනවා. අදාළ අය එතනට ගොස් එය රැගෙන යායුතුයි. එසේ තබන විටත් රැගෙන යන විටත් එහි සටහන් තැබිය යුතුය.

චීනයේ ඇති අනිත් විශේෂ ලක්ෂණය නම් යම් ප්‍රදේශයකට හදිසි අවශ්‍යතාවක් ඇති වූ විටත් සෙසු පරිපාලන දිස්ත්‍රික්ක පරිපාලන ඒකක ආදියෙන් තම ඒකක වල ඇති දෑ ඒ ආපදා ප්‍රදේශවලට ගෙනවිත් දිය යුතුය. ඒ නිසා කිසිවක් හිඟ වන්නේ නැත.

**ජනවාරි 24 ඔවුන්ගේ නව අවුරුදු උදාව ආරම්භ වන දිනයයි. ඒ වන විට වුහාන් නගරයේ රෝගය පැතිරයෑම වේගවත් විය. 24 වන දිනය පසු කළොත් තත්ත්වය බරපතලය. හේතුව අවුරුදු නිමිත්තෙන් විශාල ජනතාවක් මහමග ඔබ මොබ යනු ඇත. ඒ නිසා 23 වන දින හුබෙයි පළාතට අයත් වුහන් නගරය වසා දැමුවේය.**

වහපු ප්‍රදේශ වල සියලු ප්‍රවාහන නතර කිරීමත් සියලු දෙනා නිවෙස් තුළ සිටින ලෙසත් රජය නිවේදනය කිරීමත් මගින් පාලනය පහසු විය. ගංවතුරක් භූමි කම්පාවක් ආදී ඕනෑම විපතකදී එම ප්‍රදේශවලට ආපදා කාණ්ඩයම් වලට වෛද්‍ය ඉංජිනේරු විදුලි කාර්මික දුරකථන කාර්මික කම්කරු මේෂන් වඩු ආදී සෑම අංශයක්ම නියෝජනය වන පිරිස් ඇතුළත් වීම නිසා එම කණ්ඩායම් අංග සම්පූර්ණයි. එසේ යන පිරිස් සිතන්නේ තම රට වෙනුවෙන් කරන සේවයක් ලෙසිනි. එසේ ගොස් මරණයට පත්වුවද එය එම ජනයාට දේශානුරාගය වැඩිවීමට හේතුවකි.

ඒ අතර රටේ සෙසු ප්‍රදේශ විසින් අත්‍යාවශ්‍ය දෑ සොයා බලා ආපදා ප්‍රදේශයට යවයි. මේ හැම තැනකදීම හමුදාව යොදාගනිති. පුහුණුව ලත් සිවිල් ජනයා කරන කටයුතු සඳහා හමුදාව මගින් මෙහෙයවයි. අත්‍යාවශ්‍ය දේ ඕනෑවටත් වඩා එම ප්‍රදේශවලට ලැබීම සාමාන්‍යයි.

චීනයේ ඇති තවත් විශේෂ දෙයක් නම් දේශීය දේ අගය කිරීමයි. චීනයේ එරටට ආවේනික වූ දේශීය වෙදකම ඉතා ප්‍රචලිතය. එරට බටහිර වෛද්‍යවරු පවා එය අගය කරති. එරට ඇති සෑම බටහිර වෛද්‍ය රෝහලකටම චීන දේශීය වෛද්‍ය ඒකකයක් අනිවාර්ය වෙයි. රෝගීන්ට ප්‍රතිකාර කිරීමේදී අංශ දෙකම මගින් රෝග පරීක්ෂාව හා ප්‍රතිකාර සිදුවිය යුතුය.

කටු ගැසීම සම්භාහනය වැනි දේවල් මෙහිදී භාවිතයට නොගත්තත් නාඩි බැලීම වැනි කටයුතු සිදුවෙයි. අතට රෙදි කැබැල්ලක් තබා නාඩි බැලීම සිදු කරති. රෝගීන්ට ආසාදිතයන්ට හා ආසාධනය නොවූ අයට දේශීය ප්‍රතිකාර විශාල වශයෙන් ලබාදුනි.

ඇමරිකාවේ සියැටල් වල සිටින චීන වෛද්‍යවරයෙක් නියම කළ බෙහෙත් වට්ටෝරුවක් චීන අය අනුගමනය කළහ. එය බොන බෙහෙත් නොවේ.



මෙසේ මහා නගර ගම්මාන හෝ මහල් නිවාස වලට මුරකරුවන්

වී, වැට්, අලි, පේ වැනි ක්‍රමයට ගෙවීම් කරන්න පුළුවන්. දුරකථන

පරිගණක සියල්ල වැඩ කරන්නේ චීන භාෂාවෙන් ඒ නිසා වයසක අයටත්

ඒවා පරිහරනය කිරීම ඉතාම පහසුයි.

25 වෙනි පිටුවට..

24 වෙනි පිටුවෙන්...

# කොරෝනා ජයගත් චීන්නු...

ඖෂධ වර්ග විශාල ප්‍රමාණයක් එක්රැස් කර සාදාගත් බෙහෙත් පොට්ටනියකි. එය හැම කෙනෙක්ම වගේ සිය සාක්කුවේ දමාගෙන සිටියහ. එම දේශීය ක්‍රමවලට එරට ජනතාව ගරහන්නේ නැත. ඒවා ඉහළින්ම අනුග මනය කරති. එය මෙම රෝගය මර්ධනය කිරීමට පිටුබලයක් විය.

හුබෙයි පළාතෙන් යමෙක් ඒ වන විට පිට ප්‍රදේශයකට ගොස් සිටියා නම් ඔවුන් ඒ ප්‍රදේශවලම නිරෝධායනය කළහ. එම ස්ථානවල රතුපාට දැන්වීමක් අලවා තිබුණි. බැංකුවකට එකවර ගන්නේ දස දෙනෙකි. ඒ දසදෙනා ඉවත්වන විට තවත් දස දෙනෙකුට ඇතුළට යෑමට ඉඩ ලැබෙයි. රෝගය නොමැති ප්‍රදේශවල කඩ සාප්පු විවෘත කර තිබුණත් ඒවාට ඇතුලු වීමට අවසර නැ. මංගත (ඔන්ලයින්) ක්‍රමයට බඩු ඉල්ලූ පසු එම ඉල්ලූ ප්‍රමාණයට භාණ්ඩ මල්ලක් වෙළඳ සැල ඉදිරිපිට තබයි. අනන්‍යතාව තහවුරු කර එය රැගෙන යා යුතුය.

ඕනෑම තැනකට ඇතුල් වීමේදී උණ බැලූ අතර සෑම තැනක්ම පිරිසිදු කළහ. පැයෙන් පැයට විෂබීජ හරණය සිදු කළහ. පොදු ස්ථාන පාරවල් මහල් නිවාස මෙසේ විජබීජ හරණයට ලක්විය. සෑම කෙනෙක්ම යන එන තැන් නිරීක්ෂණයට ලක්වූ අතර පිටස්තරයෙක් පැමිණෙන්නේ නම් ලිපිනය දුරකථන අංකය ලබා දිය යුතුය.

ආපන ශාලා ඇර තිබුණත් එක් මේසයක වාඩිවිය හැක්කේ තිදෙනෙකුට පමණි. ඒවාද රෙදි වලින් හෝ වෙනත් යමකින් ආවරණය කර තිබිය යුතුය. වසංගත රෝග වලින් මිය යන අයගේ මළ සිරුරු ඥාතීන්ට බාර නොදීම කොයි රටේත් සිරිතකි. චීනයේත් එය එසේමය විය.



කියන දේ නාහන, බොරු පතුරවන හාස්‍යයට ලක් කරන පිරිස් කොයි රටේත් සිටිති. චීනයේ මේ අයට දඬුවම් බරපතල විය. ලොකු වරදකට සිර දඬුවම් දුන්නත් කුඩා වැරදිවලටදී කලේ ඔහු අසාදු ලේඛනයට එක් කිරීමයි.

ආසාදු ලේඛනයට එක්වීම ඊටත් වඩා බරපතලය. ඒ අයට දුම්රිය ටිකට් පතක් ගන්න ගියත්, ගුවන් ටිකට් පතක් ගන්න ගියත් බැංකුවකට ගියත්, ඕනෑම පොදු කටයුත්තකදී එය ඉදිරියට එයි. පාසලක ළමයෙක් දාන්න විශ්වවිද්‍යාලයකට ඇතුළු වෙන්න ආදී කිසිවක් කරගත නොහැක. සමාජ තහංචි පැනවීම සිදුවෙයි. රජයේ අවශ්‍යතා අනුව ගොඩනැගිලි පවරා ගැනීම රජය සිදු කළේය. වෛද්‍ය කණ්ඩායම් සහන කණ්ඩායම් නතර කිරීම සඳහා හෝටල් ව්‍යාපාරික ආයතන පවරා ගනු ලැබීය.

මේ හැම දෙයක්ම ඔවුන් කළේ ඉතා වේගවත්ව කාර්යක්ෂමවය. කාමර දාහකින් යුත් හුඩ් - අන් - ෂන් (අග්නි දේව කන්ද) රෝහල දින දහයකින් වැඩ අවසන් කළහ. තවත් රෝහලක් වූ කාමර 1600 ක් සහිතව ලෙයි-ෂන්-ෂන් (අකුණු දේව කන්ද) රෝහල සාදා නිම කිරීමට ඔවුන්ට ගතවූයේ දින 12 කි. මෙම වැඩබිම් වල දහස් ගනන් පිරිස් සේවය කළහ.

අවටින් ශබ්ද විකාශන යන්ත්‍ර මගින් දේශානුරාගී ගී ඇසෙන්නට සැලැස්වීය. ඔවුන් සිය රටම ජාතියට සිදු කරන මහඟු උත්කෘෂ්ට සේවාවක් සේ සලකා සිය යුතුකම ඉටුකළහ. මේ සියල්ල සඳහා එරට විවිධ සමාගම් විවිධ ආයතන මුදලින් ආධාර කළහ. රටේ බහුතර පුරවැසියන් ප්‍රමාණයක් ඒ සඳහා දායක වීය. විදෙස් ගත චීන ජාතිකයින් විශාල ලෙස උදව් කළහ. තාඕ සම්මේලනය සහ චීන බෞද්ධ සම්මේලනය විශාල වශයෙන් මුදල් ආධාර චීනයට ලබා දුන්හ.

රජයත් ජනතාවත් එකා වන්ව නැගී සිටියහ. චීන ජනයා අතර ඇති දේශානුරාගී හැඟීම සිය දියුණුවේත් කොරෝනා පාලනයේත් රහස විය. ලොව පුරා සිටින සමාජවාදීන්ට ඇති ජාතිකත්ව උණ චීන සමාජවාදීන්ට නැත. ඔවුන් දේශානුරාගයෙන් ජාතිකාභිමානයෙන් සන්නද්ධව සිය රටේ දියුණුවට සමාජවාදය යොදාගෙන ඇත. ලොව පුරා කොමියුනිස්ට්වාදය බිඳී වැටෙද්දී චීනයේ මාවෝවාදී කොමියුනිස්ට් දේශපාලනය ක්‍රමවේදය තවත් ඉදිරියට ගලා යන්නේ අප වැනි රටවලට ද ආදර්ශ සපයමිනි.

## නිදහසේ උදාන ගීතය

පලබර යුගයක් අරඹමු අරඹමු
දස්කම් විසකම් පා
පරගැති චින්තනයෙන් සිත් මුදවා
එකමුතු වෙමු සැමදා

නැති බැරි සැම හට අතහිත දිගු කොට
නව නිපයුම් බිහි කර
නව චින්තනයෙන් සිත් පුබුදා
දෑ අනුරා වඩමු

අදිරද බලවතුනට හිස නොනමා
සම්පත් මව් බිමෙහි
රැක දියුණට යොදවමු අපි
සිංහ ධජය සෙවණේ

දහඩිය වගුරා බිජුවට වපුරා
කෙත්වතු සරු කරලා
අටුකොටු පුරවමු
නවමු ලොවක් උදෙසා

ආචාර්ය රත්නපාල වික්‍රමසිංහ

## ජීවිතය

*වියැලෙන්නට පෙර*
*තණ රැඳි තුෂර*
*නික්ම යන ඔහු*
*නැවත එයි නිදන විට*
*රෑ මැදියම*
*වෙලුනු සිඟිති පුතු හා බිරිඳ*
*හාදුවට සීමා වූ පිය*
*පුතු සබඳකම*
*ජීවිතය ජීවිතයක්ද නැතහොත්*
*ගෙවාගන්නට නොහැකි*
*කරුමයක්ද*
*නැතිව බැරි මුදල්*
*සරිකරනට ජීවිතය*
*පෙනෙනවා වනසන සැටි*
*සතුට ඉතිරූ ජීවිත*

බෝමිරියේ දිලාන්ද සිල්වා
දෝහා කටාර්






## රැයක මුසු සෙනෙහස

රන්කිරි කලස හිම ඉහිරී ගනු ලද්ද
නා ගස නුඹට තවමත් නිදිමත නැද්ද
මද පවනට කෙතරම් මුසු වී ඇත්ද
අම්මාවරුනේ නැලවිලි ගී සද්ද

තාරකා පෙළට මෙය පෙනුණාවත්ද
මාලිගාව පැල්පත් අතරින් එත්ම
සෑම පිතු සිහින පුතු හිස පිරිමැද්ද
ආකහේ අදියි අරුණාලුවට ඇල්ම

පෙමිලා ඉලේසිංහ

## පිටරට රස්සාව

ලෙඩක් දුකක් හැඳුණ විටදී හද සසැලෙන්නේ
අනේ අම්මේ කියලා හැමටම කියවෙන්නේ
ඇගේ පතේ වේදනාව හද කකියන්නේ
වතුර ටිකක් දෙන්න අපිට කවුරුද ඉන්නේ

විඳිනා දුක්ගැහැට මෙහේ කව්දෝ දන්නේ
මුදල් හොයන්නට ගත සිත වෙහෙස කරන්නේ
අනුන්ගේ බැල මෙහෙවර කර දවස ගෙවෙන්නේ
ලෙඩකදි දුකකදි ගත සිත අසරණ වෙන්නේ

විඳිනා දුක් දරු පවුලට නිතර දැනේවා
ඔවුන්ගෙ හදවත් හැම විට යහපත් වේවා
දෙමව්පියන් මුදල් හොයන හැටි තේරේවා
අපෙ කඳුළැලි මත ඔවුන්ගෙ සිහින තැනේවා

ෂාමිලා චතුමිණී තුඩැල්ල, දෝහා

## අත්තම්මාගේ කවිය

පාසල ඇරෙන්නයි සීනුව නද දෙන්නේ
සේරම ළමයි එකටයි පාරට පැන්නේ
වාහන පෝලිමට කොහොමද ලංවෙන්නේ
දරුවා හොයා ගන්නට බැරුවයි ඉන්නේ

අපි ඒ දවස්වල අඩි පාරෙන් ආවේ
බෝවිට්ටියා කැලෙයි දවසම ගත වූයේ
ගමේකමට කවුරුත් හිස අත ගෑවේ
හොරෙන් ගෙනියතැයි සැක සිත් නැහැ ආවේ

කැලේ පුරා පළතුරු තිබුණා එමට
ඉස්කෝලෙට ගෙනාවා සතයට දෙකට
දැන් කඩ තිබේ වැහි වැහැලා මග දිගට
ටොපි චොකලට් කකා යති රුපියල් වලට

හවසට කුඹුරු වල වතුවල දුව පනිති
සරුංගල් යවති, හිනැහෙති ගහ ගනිති
විවේකයක් අද ඉස්පාසුවක් නැති
පන්ති පන්ති මොනවද ඉවරයක් නැති

එම්. ඩී. ශිරාණි ගුණතිලක - වාද්දුව

# සීමිත සිලෝන් ෂිපිං ලයින්ස් සමාගම
## சிலோன் ஷிப்பிங் லைன்ஸ் லிமிட்டட்
# Ceylon Shipping Lines Ltd

**ඔබේ භාණ්ඩ මව් රට ගෙන ඒමට ලොව පුරා සිටින අපගේ නියෝජිත මහතුන් හමුවන්න.**

### ඕස්ට්‍රේලියාව / அவுஸ்திரேலியா / Australia

සී. එස්. එල්. ඕස්ට්‍රේලියා
சீ. எஸ். எல். அவுஸ்திரேலியா
**C. S. L. Australia**
10/2, Dingley Ave Dandenong,
Victoria 3175, Australia.
+61397929877/0061 396023966
+61397924655
cargo@skyway.com.au/www.skyway.com.av

### ජපානය / ஜப்பான் / Japan

ජූරියා ඉන්ටර්නැෂනල්
ஜுரியா இன்டர்நெஷனல்
**Juria International**
+81283205383
+81283205384
Mobile - 0081-(90) 31027600
tea@cronos.ocn.ne.jp
tcperera@ymail.com / csl@juriaweb.com

### සිංගප්පූරුව / சிங்கப்பூர் / Singapore

එම් ඇන්ඩ් එස් එක්ස්ප්‍රස් කාර්ගෝ ලොජිස්ටික්ස්
எம் என்ட் எஸ் எக்ஸ்பிரஸ் கார்கோ லொஜிஸ்டிக் (பிரை)லிமிடட்.
**M & S Express Cargo Logistics Pte. Ltd.**
No. 23, Daihousie Lane, Singapore - 209688
+6563966614 / +6563966615
+6563966621
sales@ms5.com.sg / mifras@ms5.com.sg

### දෝහා - කටාර් / தோஹா - கட்டார்
### Doha - Qatar

ලාන්ස් ග්ලෝබල් ලොජිස්ටික්ස්
லான்ஸ் க்ளோபல் லொஜிஸ்டிக்ஸ்
**Lans Global Logistics**
PO Box - 31534, Al - Corniche Tower
Doha - Qatar.
+974 40 414141
+974 40 414199
Mobile +974 40 414141 / 077 3601554
cmb@lanslogistics.com

ගල්ෆ් පැල්කන් සර්විසස් කම්පනි (W.L.L.)
கல்வ் வெல்கன் செர்வீசஸ் கம்பனி
**Gulf Falcon Services Company (W.L.L.)**
PO Box - 7079, Doha - Qatar.
+974 44869723
+974 77885503 / +974 77883866
gulffalconcargoqatar@gmail.com

### මැලේසියාව / மலேசியா / Malaysia

ජයලංකා / ஜயலங்கா
**Jayalanka (M) SDN BHD**
No. 32 - 2 Jalan
14/48 A, Sentul Raya 51000
Kualalampur, Malaysia
603-40421896 / +966 539222031
00966 532480407
jay_langka@yahoo.com

### කුවේට් / குவைத் / Kuwait

ෆැල්කන් කාගෝ / பெல்கன் கார்கோ
**Falcon Cargo**
2952, Safat 13154, Kuwait
0096522419095, 0096522457315
0096522419098
falconcargo@hotmail.com
falcon_cargo@hotmail.com

යුනයිටඩ් එක්ස්ප්‍රස් ලොජිස්ටික්
யுனைட்டட் எக்ஸ்பிரஸ் லொஜிஸ்டிக்
**United Express Logistic**
Office No 26, Qasariya Blg - 2,
Fahaheel, Kuwait
+9652495858/+9652470862/+96522495898
info@unitedexpresslogistics.com

### ඩුබායි යූ ඒ ඊ / டுபாய் யு. ஏ. ஈ. /
### Dubai U A E

එම්බසි ෂිපිං ඇන්ඩ් ෆ්‍රේට් එල් එල් සී
எம்பசி ஷிப்பிங் என்ட் பிரைட் எல். எல். சீ
**Embassy Shipping & Frieght LLC**
P.O. Box. 32863, Al Aweer, Dubai, UAE.
Toll Free - 800 37 30
Hot Line - 055 244 99 66
Tel: +971 4 320 70 70
Fax: +971 4 320 71 71
info@embassyshipping.com
www.embassyshipping.com

නිර්මාන කාගෝ ඇන්ඩ් ලොජිස්ටික් සර්විස් /
நிர்மான கார்கோ / **Nirmana Cargo and Logistic Service**
PO Box 87556, Dubai, U.A.E.
+971 556000826

හිරු කාගෝ / இரு கார்கோ / **Hiru Cargo**
PO Box 15946,
Dubai
+971 42895750
hirumooncargo@gmail.com

මදර්ලයින් ෂිපිං / மதர்லயின் ஷிப்பிங் /
**Motherline Shipping**
PO Box 44806,
205 Second Floor,
Zainal Mohebi Plaza Building,
Opp. Centre Point, Dubai
+971 42868791
ravi@motherlines.com

ඕසියන් ලංකා කාගෝ
ஓசியன் லங்கா கார்கோ
**Ocean Lanka Cargo**
P.O. Box - 48843,
Dubai - UAE
00971-04-2640054
Mobile - 00971-0555 491 987
oceanlankacargolk@gmail.com

ලක්බිම කාගෝ / லக்பிம கார்கோ
**Lakbima Cargo**
P.O. Box - 22675,
Ajman, UAE.
+971 6 7480522

### බහරේන් / பஹறைன் / Bahrain

කලම්බු කාගෝ කම්පැනි
கொழும்பு கார்கோ கொம்பனி
**Colombo Cargo Company**
Bahrain
Block 321, 338, Building No 177
Manama / Alaudayiyah,
Kingdom of Bahrain.
+973 35939343
+973 17 811707
colombosuppliersbhn@gmail.com

### සවුදි අරාබිය / சவுதி அரேபியா
### Saudi Arabia

**Jeddah**

වර්ල්ඩ් වයිඩ් ෆ්‍රේට් / வேல்ட் வைட் பிரைட்
**World Wide Freight**
World Wide Link,
(A Div. Of Khalid Nazer Ahames Al Gahathani Trading Est) Jeddah, K.S.A.
0505657412/0500773931/0543902880
+96626350650/+96626476087/026350650
imthiyaz85360@yahoo.ca

දමාම් / **Dammam** / தமாம்

ඒ බී ටී කාර්ගෝ සර්විස් / ஏ.பி.டி. கார்கோ
**ABT Cargo Services**
+966550952031

රියාද් - ரியாத் - **Riyadh**

ඒ බී ටී කාර්ගෝ සර්විස් / ஏ.பி.டி. கார்கோ
**ABT Cargo Services**
Riyadh Office: +966 112700055
+966555892754
+966532083640
abtcargo2016@gmail.com

ෆේම් කාගෝ / பேம் கார்கோ / **Fame Cargo**
P.O. Box 17958, Riyadh 11494
2442032/4793845/0508273719
4793845 / 00966 - 583090555
fameruhcmb@gmail.com

### ලෙබනන් / லெபனான் / Lebanan

ජිහාඩ් රොක්ස් ෂිපිං ඇන්ඩ් ට්‍රේඩිං
ஜிஹாட் ரொக்ஸ் சிப்பிங் அன்ட் ரேடிங்
**Jihad Roukz Shipping & Trading**
JRC, Chbenieh Baadba, Beirut, Lebanon
00961 - 254733 / 00961 - 3773244
0096111242677
lanka _cargo@hotmail.com

### ස්විට්සර්ලන්තය / சுவிட்சர்லாந்து
### Switzerland

එම් සී එස් කාගෝ / எம் சீ எஸ் கார்கோ
**M C S Cargo**
M.T. & T Gmbh, Sperietweg 1, 8052
Zurich, Switzerland.
0041-796656563 / 0041- 443025838
mcscargo@swissmail.com

### කැනඩාව / கனடா / Canada

සීකැන් ට්‍රාන්ස්කොන්ටිනන්ටල්
சீகேன் ட்ரான்ஸ்கொன்டினன்டல்
**Ceycan Transcontinental**
1981, Boylen Road,
Unit # 5, Mississawga, Ontairo,
L5slR9
+9056739873
+9056739905
cslcanada2001@gmail.com
ceycantrans@gmail.com

### එංගලන්තය / இங்கிலாந்து
### United Kingdom

ජේ පී එන් ෂිපිං / ஜே பி என் சிபிங்
**JPN Shipping**
Unit A2c, Redlands
Coulsdon cR5 2HT wk
02086680252
info@jpnshippingltd.co.uk


මාස් ග්ලෝබල් ෂිපිං
மாஸ் குளோபல் ஷிப்பிங்
**Mass Global Shipping**
044(0)208 4221232
208 8644244
info@masshipping.com

ඊසි ෂිපිං ලිමිටඩ් / ஈஸி ஷிப்பிங் லிமிட்டட்
**Easy Shipping Ltd.**
Unit 15, Liongate Enterprise Park
80, Moden Rd, Mitcham cR4 N4
02086489092 / 07908787627
info@easyshippingltd.co.uk
www.easyshippingltd.co.uk

ඇට්ලස් ෂිපිං / அட்லஸ் ஷிப்பிங்
**Atlas Shipping**
430, High Road, Willesden,
London. NW 10 2HA
02084596633 / 0794743535
ajantha.atlasshipping@gmail.com

### ඇමරිකාව / அமொரிக்கா / America

කලම්බු එක්ස්ප්‍රස් / கொழும்பு எக்ஸ்பிரஸ்
**Colombo Express**
1115, Inman Ave, Suite - 323
Edison NJ - 08820
1888 232 1952
nishan@colomboexpress.com
www.colomboexpress.com




**Call us now,**
**Ceylon Shipping Lines Travels**
**No. 450, D.R. Wijewardena Mawatha,**
**Colombo 10**
**Tel : 011 - 2689500 - 8**

**Eranga : 077 267 2970**
**Lakmali : 077 357 2835**
**Roshadi : 077 356 1210**

CSL TRAVELS

# විශ්මිත ගුණ ඇති කෝමාරිකා



ඇමරිකාව, අප්‍රිකාව ඉන්දියාව පකිස්තානය සහ ශ්‍රී ලංකාව වැනි රටවල උෂ්ණ කලාපීය ප්‍රදේශ ආශ්‍රිතව සරුවට වැඩෙන කටු සහිත දික් හැඩැති කොළ ඇති ශාක විශේෂයකි කෝමාරිකා. මෙය ලිලියාසේ (Liliaceae) කුලයට අයත් ඇලෝ ඉන්ඩිකා (Aloe Indica) යන උද්භිද විද්‍යාත්මක නමින් හැඳින්වේ.

## කෝමාරිකා වල ඖෂධීය ගුණය

මිනිස් සිරුරට අවශ්‍ය ඇමරයිනෝ අම්ල විසි දෙකකින් විස්සක් අඩංගුය. ශරීරයට නිපදවා ගත නොහැකි අත්‍යාවශ්‍ය ඇමයිනෝ වර්ග හතක්ම එහි අඩංගුය. අධික ප්‍රෝටීන ප්‍රමාණයකින් සමන්විත වේ. මෙහි විටමින් ඒ, විටමින් ඊ, විටමින් සී, සහ විටමින් බී අඩංගුය. පැරැන්නෝ විටමින් ඒ ඌනතාවය නිසා ඇති වන රාත්‍රී අන්දභාවය සඳහා ඖෂධයක් ලෙසින් මෙය භාවිතා කර ඇත. සමහර පිළිකා, රුධිරය තුළ ඇතිවන ප්‍රෝටීන ඌනතාවය වැළැක්වීමට පිළියමක් ලෙස කෝමාරිකා යුෂ වලින් සාදන පානයක් භාවිතා කළේය. රෝගියෙකු දරුණු ආබාධිත තත්ත්වයනට පත්ව ESR නමැති රුධිර පරීක්ෂණයේ ඉහල අගයක් ඇතිවිට එය ඉක්මනින් පහල මට්ටමට ගෙන ඒමට කෝමාරිකා යුෂ භාවිතා කෙරේ.

## කෝමාරිකා වල ප්‍රයෝජන

**විවිධ රෝග නිවාරණය**

අක්ෂි රෝග, පෝෂණ ඌනතා රෝග, රක්තහීනතාවය, දුර්වල ප්‍රතිශක්තියක් ඇතිවිට එය මර්ධනයට, ආමාශික තුවාල (ගැස්ට්‍රයිටිස්) අන්ත්‍රගත තුවාල, ගුදය මගින් රක්තවහනය වීමේදී, අර්ශස් වලට සම්බන්ධ අන්ත්‍රගත පිළිකා, චර්ම පිළිකා ලේ පිළිකා ආදියට ඔසප් චක්‍රය ආශ්‍රිත විවිධ රෝග සඳහා ආර්තව හරණය නිසා ඇතිවන රෝග, සුව නොවන තුවාල සුව කිරීමට, රූපලාවණ්‍ය ප්‍රතිකාර දිවැඩියාව සහ උන්මාද රෝග ආදී විවිධ රෝග සඳහා ප්‍රතිඵලදායක ඖෂධයකි. කෝමාරිකා ඖෂධයක් ලෙස භාවිතා කිරීමේදී පිළිකාව හෝ එම ගෙඩිය විනාශ කර දමයි.





අම්ල පිත්ත රෝගය හෙවත් ගැස්ට්‍රයිටිස් රෝගය සඳහා විවිධ ඖෂධ වර්ග දක්නට ලැබුනත්, රෝගය සුවවන ආකාරයේ ගුණයක් නොලැබෙන බව නොරහසකි. එම රෝගී අවස්ථාව සඳහා කෝමාරිකා වටිනාඖෂධයකි. ගැස්ට්‍රයිටීස් වලදී ආමාශයික යුෂ ප්‍රමාණය ඉහල යාමක් සිදුවේ. ආමාශය වටා ඇතුළතින් ඇති ආවරන පටලය ඇල්කොලයිඩ් මගින් ගැස්ට්‍රික් හෝමන පාලනය කර ආමාශයික යුෂ වැඩිපුර ගලායාම සීමා කරයි. ඇල්කොලයිඩ් මගින් මිනිස් මොළයේ සමහර ස්ථාන වෙත බලපෑමක් කර මානසික සන්සුන් බව ඇති කිරීමෙන් ආමාශයික යුෂ ගලාඒම පාලනය කරයි.

කෝමාරිකා තවත් ආකාරයකින් ස්ත්‍රීන්ට දිවි ඉදිමේ. පසුව එය ආමාශයික තුවාල ඇතිවීම දක්වා වැඩිවේ. එවැනි අවස්ථාවක කෝමාරිකා ශාකයේ ජෙලි වැනි කොටස බීමක් වශයෙන් ගත්විට ප්‍රත්‍යක්ෂ ලෙස සුවය ලැබේ. කෝමාරික වල ඇති සිසිලස ගුණය නිසා ආමාශයේ වේදනාව නැති කරනු ලැබේ. එහි ඇති හිරිවැටීමේ ගුණය මගින් ආමාශයේ වේදනාව තව දුරටත් අඩු කරනු ඇත. මෙහි ඇති විශේෂ ඔසුවකි. සෑම ස්ත්‍රියක්ම ආර්තවහරණයත් සමඟ විවිධ රෝගී තත්වයන් රෝග ලක්ෂන දක්නට ලැබේ. ශරීරය තුළ ස්ත්‍රී හෝමෝන අඩුවීම මෙයට ප්‍රධාන හේතුව වේ. මේ නිසා ශරීරයේ ඇතිවන දැවිල්ල, ඇඟපත වේදනාව, ශරීරයේ ගින්දර පිටවෙන්නාසේ දැනීම, නින්ද නොයාම ආදී විවිධ රෝග වලට ගොදුරු වේ. එවැනි ස්ත්‍රීන්ට කෝමාරිකා පානයක් වශයෙන් භාවිතය වඩාත් සුදුසු වේ. එයින් කෝමාරිකා වල අඩංගු ඊස්ට්‍රජන් වලට සමාන රසායනික ව්‍යුහයක් ඇති ඇල්කොලයිඩ් මගින් ඊස්ට්‍රජන් හෝමෝනයේ අඩුව පිරිමසයි.

රූපලාවන්‍ය ප්‍රතිකාර වශයෙන් ඉතාමත් ජනප්‍රිය ඖෂධයකි. ශරීරයේ කළු පැහැති ස්වභාවය ඉවත් කර දීප්තිමක් සුදු පැහැති සමක් ලබා දෙයි. දිනපතා කෝමාරික යුෂ සම්මත ආලේප කිරිමෙන් අධික සූර්යාලෝකයෙන් මෘදු සම ආරක්ෂා කිරීම සිදුවේ. කෝමාරික යුෂ මගින් සම තුළට විකිරණ ඇතුලු වීම වළකාලන අතර සමට ආරක්ෂක පටලයක් ලෙස ක්‍රියා කිරීමද සිදුවේ. කෝමාරිකා යුෂ ෂැම්පු එකක් වශයෙන් භාවිතයට ගැනීමෙන් හිස් හොරි හිසේ ඇතිවන තුවාල සුවපත් කරගත හැකිය.

විවිධ නිෂ්පාදන බොහොමයක් වෙනුවෙන් කෝමාරිකා භාවිතයට ගනී. ෂැම්පු වර්ග, ක්‍රීම් වර්ග ඖෂධ, පවුඩර්, තෙල් වර්ග, බාම් වර්ග මෙන්ම විවිධ පානයන් ද වෙළඳපලේ පවතී. අතුරු ආබාධ අවමය. මෙවන් වූ වටිනා ඖෂධීය ශාකයන් බිහිවීමත් අපගේ වටිනා සම්පතකි. අමෘර්තයන් බඳු වූ ශාක පරිසරයේ නිර්මාණය වීම මිනිසාගේ වාසනාවකි. ගෙවත්තේ මෙවන් වටිනා ඖෂධ සිටුවීමට උනන්දුවීම අපට ඔබට මෙන්ම මුළු රටටම කරනා සේවයකි.

### කෝමාරිකා වලින් ප්‍රනීත පානයක්

හොඳින් වැඩුණු කෝමාරිකා පිත්තක් ගෙන එහි යුෂ භාජනයකට සූරා ගන්න. එම කෝමාරිකා ජෙලි කොටස මෙන් හත් ගුණයක් ජලය එක්කර ගන්න. අවශ්‍ය පමණට සීනි මිශ්‍රකර ගන්න. මෙම ද්‍රාවනය සෙල්සියස් අංශක 70 ක් පමණ උෂ්නත්වයකට රත්කර ගන්න. මෙම ද්‍රාවනය වෙනම භාජනයකට පෙරා ගන්න. මෙය නිතර වීදුරු භාගයක් පමණ පානය කළ හැකිය.

### සාදාගන්නා ආකාරය

තම්බාගත් උළුහාල් ස්වල්පයකට කෝමාරිකා මදය ස්වල්පයක් කලවම් කර හොඳින් මිශ්‍රකර ගැනීමෙන් සෙවල සහිත ද්‍රාවනයක් සෑදේ. එය නෑමට පැයකට පෙර හිස ගල්වන්න. මේ තුළින් හිස්හොරි, හිසේ තුවාල සුවවේ. තවද විටමින් ඊ නිසා හිසකෙස් වර්ධනය සිදුවේ. හොඳ පෝෂණයක්ද ලැබේ.



# Ceylon Shipping Lines Ltd



450, D.R. Wijewardena Mawatha,
P.O. Box 891, Colombo 10, Sri Lanka.
Tel: (011) 2689500-508, 2680311-315
Fax: (011) 2689510, 2674347
E-mail: csl123@sltnet.lk
cslmgmt@sltnet.lk
Web: www.ceylonshippinglines.com
Contact: Neranjan - 0777224617







Ceylon Shipping Lines Ltd.

SLSI SYSTEM CERTIFIED ISO 9001
MGMT. SYS. RvA C 155
PATA Pacific Asia Travel Association
IATA
TAASL

***Serving with Excellence***

- Customs Bonded Warehousing
- Unaccompanied Personal Baggage Clearing & Door to Door Home Delivery Covering Major Cities in Sri Lanka Connecting with Worldwide Destinations
- Managing Processing, Shipping Forwarding & Distribution of Imports & Exports
- Airline Ticketing & Travel Agency
- City Central Container Depot Freight Station & Island wide Transportation
- Printing & Publishing